# විල්මැන්න එල්ලංගා පැතිකඩ සහ මුලික සංවර්ධන සැලැස්ම

# හම්බන්තොට දිස්ත්‍රික්කය

**දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය**

**නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලය**

**දකුණු පළාත**

**2025**

## පටුන

| | | |
|---|---|---|
| **1.** | **හැඳින්වීම** | **4** |
| 1.1 | හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරා ගත් එල්ලංගා පද්ධති | 5 |
| 1.2 | විල්මැන්න එල්ලංගාව | 6 |
| 1.3 | විල්මැන්න එල්ලංගාවේ සිතියම | 8 |
| 1.4 | විල්මැන්න එල්ලංගා පද්ධතිය තිරසර ලෙස කළමනාකරණය කිරීමේ වැදගත්කම | 11 |
| 1.5 | එල්ලංගා කළමනාකරණ කමිටුවක අවශ්‍යතාවය | 12 |
| 1.6 | එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීම | 12 |
| 1.7 | එල්ලංගා කළමනාකරණ කමිටුවෙහි කාර්ය භාරය සහ වගකීම් | 15 |
| 1.8 | එල්ලංගා කළමනාකරණ පැතිකඩක් සහ සැලසුමක් සකස් කිරීමේ අවශ්‍යතාවය | 15 |
| **1.9** | විල්මැන්න එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ දී භාවිතා කල ක්‍රමවේදය | 16 |
| **1.10** | විල්මැන්න එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අරමුණු | 16 |
| 1.11 | එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ ක්‍රමවේදය | 17 |
| **2.** | **විල්මැන්න එල්ලංගා පැතිකඩ** | **18** |
| 2.1 | භූ විෂමතාවය සහ භූ රූපණය | 18 |
| 2.2 | ඉඩම් පරිහරණය | 20 |
| 2.3 | ජල විද්‍යාත්මක තොරතුරු | 23 |
| 2.4 | පාරිසරික තොරතුරු | 25 |
| 2.5 | මානව ජීවනෝපාය කටයුතු සම්බන්ධ තොරතුරු | 26 |
| 2.6 | සමාජ ආර්ථික තොරතුරු | 27 |
| 2.7 | එල්ලංගාව තුල දැනට සිදු කරමින් පවතින ඉදිකිරීම් කටයුතු | 27 |
| 2.8 | එල්ලංගාවේ කෘෂිකාර්මික කටයුතු | 27 |
| 2.9 | භෝග වගා රටාව | 28 |
| **3.** | **එල්ලංගාවේ වාරිමාර්ග කළමනාකරණ විස්තර** | **31** |
| 3.1 | පෝෂක ප්‍රදේශය | 31 |
| 3.2 | එල්ලංගා පද්ධතිය මුහුණ දෙන ගැටළු(ප්‍රධාන අභියෝග) | 32 |
| 3.3 | ප්‍රධාන ගැටළු | 32 |
| 3.4 | උග්‍ර ගැටළු | 32 |
| 3.5 | වෙනත් පොදු ගැටළු | 33 |
| **4.** | **එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම** | **36** |

**වගු ලේඛණය**


1. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරා ගත් එල්ලංගා පද්ධති පිළිබඳ විස්තර 5
2. විල්මැන්න එල්ලංගාවට අයත් වැව් 6
3. විල්මැන්න එල්ලංගාව පරිපාලන තොරතුරු 7
4. එල්ලංගාවේ වැව් යටතේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතුවල වර්තමාන තත්වය 11
5. ඉඩම් පරිහරණ දත්ත 22
6. ජල විද්‍යාත්මක තොරතුරු 23
7. පසුගිය වසර 03 තුල වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිලිබද විස්තර 29
8. දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මිගින් වැව් පුනරුත්ථාපනයෙන් පසු එක් භෝගය යටතේ වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය 30
9. පෝෂක ප්‍රදේශ විස්තර 31
10. වැව් අනුව ඇල මාර්ග විස්තර 32
11. එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම 36
12. දල ඇස්තමේන්තු රේඛිය ආයතන අතර බෙදී යාම සහ අපේක්ෂිත ප්‍රජා දායකත්වය 40
13. ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුල දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය විසින් අපේක්ෂිත මැදිහත්වීම 44


**සිතියම් ලේඛණය**


1. විල්මැන්න එල්ලංගා පද්ධතියට අයත් වැව් සහ අමුණුවල පිහිටීම 10
2. විල්මැන්න එල්ලංගා වට අයත් ප්‍රදේශයේ භූ විෂමතාවය 19
3. ඉඩම් පරිහරණය 21
4. විල්මැන්න එල්ලංගා පද්ධතිය- ඉඩම් පරිහරණ ගැටළු 35


**රූප සටහන් ලේඛණය**


1. විල්මැන්න එල්ලංගාව චන්ද්‍රිකා ඡායාරූපයක් ඇසුරින් 9
2. එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන 14
3. ඉඩම් පරිහරණ ව්‍යාප්තිය 22
4. එල්ලංගා පද්ධතියක ප්‍රධාන අංග 24


**ඇමුණුම්**


1. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කළමනාකරණ කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.23 දිනැති 6/2023 දරණ චක්‍රලේඛය 46
2. උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය 51

# 1. හැඳින්වීම

පරිසරය, ජල විද්‍යාත්මක හා භූ විද්‍යාත්මක සාධක ආරක්ෂා කරමින්, කෘෂිකර්මාන්තය සඳහා ඵලදායි ලෙස හා කාර්යක්ෂමව ජලය ගබඩා කිරීම, කළමනාකරණය කිරීම සහ භාවිතා කිරීම සඳහා ක්ෂුද්‍ර මට්ටමේ ග්‍රාමීය වාරි වැව් පද්ධතියක් සම්බන්ධ කරන ලද පුරාණ ස්වභාවික වාරිමාර්ග යටිතල පහසුකම් ජාලයක් ලෙස ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ එල්ලංගා පද්ධතිය අර්ථ දැක්විය හැකිය. එල්ලංගා කළමනාකරණය යනු තිරසාර එල්ලංගා ක්‍රියාකාරිත්වය, මූල්‍ය, තාක්‍ෂණික සහ මානව සම්පත් අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා ඉන් ප්‍රතිලාභ ලබන පුද්ගලයින් පිරිසක් සමඟ එල්ලංගා කළමනාකරණ කමිටුව විසින් ගනු ලබන සාමූහික ක්‍රියාමාර්ග වේ.

එල්ලංගා පද්ධතිය (එල්ලංගාව) යනු වියළි කලාපීය භූ දර්ශනයේ සුළු හෝ මධ්‍යම පරිමාණ ජල පෝෂකයක් තුළ සංවිධානගත වූ එකිනෙකට සම්බන්ධිත වැව් පද්ධතියකි. අප දන්නා පරිදි මෙම මධ්‍යම පරිමාණ ජල පෝෂක ප්‍රදේශවල ඇති වැව්, ජලය ගබඩා කිරීමට, ප්‍රවාහනය කිරීමට සහ ප්‍රයෝජනයට ගැනීමට උපකාරී වේ. වියළි කලාපයේ භූ විද්‍යාව සහ භූ විද්‍යාත්මක ව්‍යුහය ද වැව්වල ව්‍යාප්තිය පාලනය කරන සාධක වේ. බොහෝ වැව් ඉදිකර ඇත්තේ ප්‍රාග්කේම්බ්‍රිය භූවිෂමතාවයක වන අතර, බොහෝ අවස්ථාවලදී පාෂාණ නිරාවරණය වැව් බැම්ම ලෙස භාවිතා කර ඇත. කෙසේ වෙතත්, වැව් පිටිය පිහිටා ඇත්තේ ඇලූවියල් තැන්පතු මත සහ විවිධ ඝනකම සහිත පාෂාණ ස්ථර මත ය.

ශ්‍රී ලංකාවේ වියළි කලාපීය එල්ලංගා පද්ධති ලොව පුරාණ ශිෂ්ටාචාර අතර සුවිශේෂී ජල සම්ප්‍රේෂණ සහ කළමනාකරණ පද්ධතියක් ලෙස පුළුල් කොට සැලකේ. වැව් එල්ලංගා පද්ධති ක්‍රි.පූ 3 වැනි සියවසේ සිට ශ්‍රී ලංකාවේ වාරි පද්ධතිවලට බලපෑම් කරන බව දන්නා කරුණකි. ක්‍රි.පූ 3 වැනි සියවසේ සිට ශ්‍රී ලංකාවේ වියළි හා අතරමැදි කලාප තුළ පහත් බිම්වල ඇති එල්ලංගා පද්ධති මතුපිට ජල සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සඳහා විකාශනය වී ඇත. භූගෝලීය සිතියම් මගින් නිදසුන් වන පරිදි වැව්වල අවකාශීය ව්‍යාප්තිය සාමාන්‍ය රටාවක් අනුගමනය කරන බව පෙනේ. අතීතයේ සිටම ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ප්‍රජා තිරසාර සංවර්ධනය සඳහා වැව් එල්ලංගා පද්ධතිය (TCS) විස්මිත කාර්යභාරයක් ඉටු කරන බව සඳහන් කළ හැකිය. මේ වන විට ලෝකය දේශගුණික විපර්යාසයන්ට මුහුණ දී සිටින අතර ශ්‍රී ලංකාවටද බලපෑම් එල්ල වෙමින් පවතී. කෘෂිකර්මාන්තය මත පදනම් වූ රටක් ලෙස අප රටේ වියළි කලාපයේ ජලය සංරක්ෂණය කළ යුතුය. වැව් එල්ලංගා පද්ධතිය මෙම තත්ත්වය සඳහා වඩා හොඳ විසඳුමක් වනු ඇත. සමාජ සංහිඳියාව සඳහා නවීන පාරිසරික පසුබිමක් සපයන වැව් එල්ලංගා පද්ධතියේ පවතින කාර්යයන් අවම වශයෙන් ආරක්ෂා කර ගැනීමට නිවැරදි තීරණ ගැනීමේ උපාය මාර්ග ගත යුතුය. එබැවින්, වැව් එල්ලංගා පද්ධතිය නිසි තිරසාර සැලසුමක් සහිතව සංවර්ධනය කළ යුතුය.

ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ඈත අතීතයේ සිටම වර්ෂා ජලය සහ මතුපිට ජලය කුඩා වැව්වල ගබඩා කර ඇති අතර අද වන විට වී වගාව සහ අනෙකුත් වගාවන් සඳහා වාරි ජලය ලබා දෙයි. ජනවාරි-අප්‍රේල්

සහ සැප්තැම්බර්-දෙසැම්බර් මාසවල ප්‍රධාන වර්ෂා කාල දෙකේදී, මතුපිට ජලය මෙම කුඩා පරිමාණ වැව්වල එකතු කර ගබඩා කර, වියළි කාලවලදී බෑවුමේ පහළ පිහිටි කුඹුරුවලට බෙදා හරිනු ලැබේ.

මෙම එල්ලංගා කළමනාකරණ පැතිකඩ සහ සැලැස්ම අනාගත එල්ලංගා කළමනාකරණ ක්‍රියාවලියේ දී මාර්ගෝපදේශයක් ලෙස භාවිතා කිරීම සඳහා, ප්‍රධාන සංවර්ධන ගැටළු සහ ඒවා අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා ගොවි සංවිධාන නායකයින් සහ රේඛීය ආයතනවල නියෝජිත නිලධාරීන් සමඟ සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලිය යොදා ගනිමින්, විල්මැන්න එල්ලංගා පද්ධතිය සඳහා සකස් කර ඇත. . කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය 2025 වර්ෂය තුළ එල්ලංගා කළමනාකරණ කමිටුව සමඟ මෙම පැතිකඩ සහ කළමනාකරණ සැලැස්ම සකස් කිරීම සඳහා පහසුකම් සපයන ලදී.

## 1.1 හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරා ගත් එල්ලංගා පද්ධති

**වගුව 1. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තෝරා ගත් එල්ලංගා පද්ධති පිළිබඳ විස්තර**

| අනු අංකය | එල්ලංගාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | එල්ලංගාවට අයත් වැව් සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | බැමිණියාව | හම්බන්තොට | 9 |
| 02 | විල්මැන්න | හම්බන්තොට | 6 |
| 03 | මත්තල | ලුණුගම්වෙහෙර | 9 |
| 04 | වීරවිල | ලුණුගම්වෙහෙර | 26 |
| 05 | බැඹව | තිස්සමහාරාමය | 11 |
| 06 | කොච්චිපතාන | තිස්සමහාරාමය | 3 |
| 07 | නිමලව | තිස්සමහාරාමය | 6 |
| 08 | යෝධ වැව | තිස්සමහාරාමය | 10 |
| එකතුව | | | **80** |

ඉහත වගුවට අනුව හම්බන්තොට,ලුණුගම්වෙහෙර සහ තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල එල්ලංගා පද්ධති 08 ක් තෝරා ගෙන ඇත.

තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැව් මැණික් ගංගා ද්‍රෝණිය යටතේ පවතින අතර, හම්බන්තොට සහ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල වැව් කිරිදිඔය ගංගා ද්‍රෝණිය මගින් ආවරණය වේ. ගංගා ද්‍රෝණි දෙකෙහිම වැව් 84 ක් ව්‍යාපෘතිය යටතේ තෝරා ගෙන ඇතත්,වැව් 04 ක් එල්ලංගා පද්ධතියකට අයත් නොවේ. වැව් 06 කින් සමන්විත විල්මැන්න එල්ලංගාව හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට

අයත් නමුත් එකිනෙක සම්බන්ධ වූ එම සියලුම වැව් කළමනාකරණය කරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගිනි.

## 1.2 විල්මැන්න එල්ලංගාව

හම්බන්තොට දිස්ත්‍රික්කය උතුරින් මොණරාගල සහ රත්නපුර දිස්ත්‍රික්කවලින් ද, නැගෙනහිරින් ඉන්දියන් සාගරයෙන් සහ අම්පාර දිස්ත්‍රික්කයෙන්ද, දකුණින් ඉන්දියන් සාගරයෙන් ද, බටහිරින් මාතර දිස්ත්‍රික්කයෙන් ද මායිම් වේ. එය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 12 කින් සහ ග්‍රාම නිලධාරී වසම් 576 කින් සමන්විත වේ. මුළු භූමි ප්‍රමාණය වර්ග කිලෝමීටර් 2609 ක් පමණ වන අතර, එය විශාලත්වය අතින් දොලොස්වන ස්ථානය ගනී.

විල්මැන්න එල්ලංගාව ශ්‍රී ලංකාවේ, දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. හම්බන්තොට දිස්ත්‍රික්කයේ හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට, බදගිරිය ගොවිජන සේවා මධ්‍යස්ථානයට සහ ග්‍රාම නිලධාරී වසම් 01 කට අයත් වේ. කුඩා වැව් 06 ක් මෙම එල්ලංගාවට අයත් වේ.

වගුව **2.** විල්මැන්න එල්ලංගාවට අයත් වැව්

| අනු අංකය | වැවෙහි නම | වැවේ පිහිටීම දැක්වෙන බණ්ඩාංක | | ග්‍රාම නිලධාරී වසම | පෝෂක ප්‍රදේශය(අක්කර) | ගොවි පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | | අක්ෂාංශ | දේශාංශ | | | |
| 1 | විල්මැන්න වැව | 6.229659 | 81.252207 | බුන්දල | 80 | 37 |
| 2 | මලිත්ත වැව* | | | බුන්දල | | |
| 3 | යෝධමහ වැව | 6.216385 | 81.248345 | බුන්දල | 35 | 14 |
| 4 | මුරුංග වැව | 6.212295 | 81.247985 | බුන්දල | 30 | 09 |
| 5 | බුන්දල වැව | 6.208385 | 81.246433 | බුන්දල | 14 | 07 |
| 6 | වැන්දැව වැව** | | | බුන්දල | | |
| **එකතුව** | | | | | **163** | **67** |

*මෙම වැව යටතේ වගා නොකරයි

**නටබුන් වී ඇත.මෙම වැව යටතේ කුඹුරු/හේන් දැනට වගා නොකරයි.ලවණතාවයෙන් යුක්ත ය.එහෙත් වැව් බැම්ම කැඩීමට පෙර අක්කර 15 ක් වගා කර ඇත.(මෙයට වසර 25 කට පෙර)

වගුව 3. විල්මැන්න එල්ලංගාව පරිපාලන තොරතුරු

| මූලික තොරතුරු | විස්තර | විශේෂිත කරුණු |
|---|---|---|
| දිස්ත්‍රික්කය | හම්බන්තොට | – |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | හම්බන්තොට | – |
| මැතිවරණ බල ප්‍රදේශය | හම්බන්තොට | – |
| ගංගා ද්‍රෝණිය | කිරිදි ඔය | – |
| එල්ලංගාව | විල්මැන්න | – |
| ග්‍රාම නිලධාරී වසම/වසම් | බූන්දල,සාලියපුර | |
| එල්ලංගාවේ භූමි ප්‍රමාණය | හෙක්ටයාර් 1147.98 | |
| කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන වැව් සංඛ්‍යාව | වැව් 04 | |
| පැහැදිලිව හඳුනා ගත හැකි ජල පෝෂක ප්‍රදේශ | | – |
| රක්ෂිත | බූන්දල රක්ෂිතය (මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 6216) සහ විල්මැන්න අභය භූමිය (මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර් 3,339.38) | |
| පෝෂක ප්‍රදේශයේ පදිංචි පවුල් සංඛ්‍යාව | 67 | |
| වනාන්තර තුල පිහිටි වැව් සංඛ්‍යාව | 01 | |
| එල්ලංගාව තුලින් ජීවනෝපාය සැලසෙන පවුල් සංඛ්‍යාව | 67 | |

## 1.3 විල්මැන්න එල්ලංගාවෙහි සිතියම

පැවති විල්මැන්න එල්ලංගා පද්ධතියේ සිතියම යාවත්කාලීන වී නැත. එම නිසා වඩාත් නිවැරදි සිතියමක් එල්ලංගා පැතිකඩට ඇතුලත් කිරීමේ අපේක්ෂාවෙන් ක්ෂේත්‍රයේ දී එකතු කර ගන්නා ලද දත්ත පදනම් කරගෙන නව සිතියමක් නිර්මාණය කරන ලදී.

ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් සකස් කරන ලද සිතියම්, සිතියම් අංක 1 සහ රූප සටහන 1 යටතේ පහත දැක්වේ.




රූප සටහන 1 විල්මැන්න එල්ලංගාව චන්ද්‍රිකා ඡායාරූපයක් ඇසුරින්

මූලාශ්‍රය ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

සිතියම 1 විල්මැන්න එල්ලංගා පද්ධතියට අයත් වැව්වල පිහිටීම




මූලාශ්‍රය ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 1.4 විල්මැන්න එල්ලංගාව තිරසර ලෙස කලමණාකරනය කිරීමේ වැදගත්කම

විල්මැන්න එල්ලංගාවේ වැව් 04 ක් යටතේ දල වශයෙන් හෙක්ටයාර් 65 ක් පමණ මහ කන්නයේ වී හා ගොඩ බෝග වගා කරනු ලබයි. එම ගොවීන් සංඛ්‍යාව 67 ක් පමණ වේ. කුඹුරු වගා ගොවීන් සහ හේන් වගා ගොවීන් එල්ලංගාවෙන් ජීවනෝපාය සලසා ගන්නා අතර ඔවුන් කුඩා වැව් වලින් ලැබෙන ජලය හා වර්ෂාවෙන් ලැබෙන ජලය ප්‍රයෝජනයට ගෙන වගා කටයුතු සිදු කරනු ලබයි. කෙසේ වුවද මෑතකදී එල්ලංගා පැතිකඩ සංවර්ධනය සඳහා සිදු කරනු ලැබූ සහභාගීත්ව ක්‍රමවේදයක් වන හරස්කඩ චාරිකාවෙන් හා අදාල ලේඛණ පරිශීලනය මගින් එකතු කරන ලද, ජනනය කරන ලද දත්ත හා තොරතුරු තුලින් එල්ලංගාවේ විවිධ අංශ විවිධ හේතු නිසා හානියට පත් වී ඇති බව අනාවරනය විය.කෙසේ වූවද එල්ලංගාවේ පිහිටි වැව් 06 එල්ලංගා සංවර්ධන ප්‍රවේශය (Cascade Development Approach) උපයෝගී කරගනිමින් ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කරනු ලබන අතර, එහි දී මුළු පද්ධතියේ තිරසර පැවැත්ම තහවුරු වන ආකාරයට එල්ලංගාව සංවර්ධනය සඳහා විශේෂ අවධානයක් යොමු කරයි. ඒ අනුව එල්ලංගා කලමණාකරන සැලැස්මක් සකස් කර යෝධ වැව එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය අවධානය යොමු කර ඇත.

එහිදී එල්ලංගා කලමණාකරන කමිටුවට එල්ලංගා පැතිකඩක් හා අවසාන වශයෙන් එල්ලංගා කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමට ව්‍යාපෘතියේ සහාය ලබා දේ.

විල්මැන්න එල්ලංගාව යටතේ පවත්නා වැව් සහ ඒ යටතේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතුවල වර්තමාන තත්වය පිලිබඳ දත්ත පහත වගුව 4 මගින් දක්වා ඇත.

**වගුව 4 එල්ලංගාවේ වැව් යටතේ සිදු කරනු ලබන කෘෂිකාර්මික කටයුතුවල වර්තමාන තත්වය**

| අනු අංකය | වැවේ නම | වැව යටතේ වගා කරනු ලබන කුඹුරු බිම් ප්‍රමාණය (අක්කර) | කුඹුරු ගොවීන් සංඛ්‍යාව | අස්වැන්න දල වශයෙන්අක්කරයට/බුසල් | හේන් ගොවීන් සංඛ්‍යාව | විශේෂයෙන් කිව යුතු කරුණු |
|---|---|---|---|---|---|---|
| 1 | විල්මැන්න වැව | 80 | 38 | | | යල මහ දෙකන්නයේ දීම වගා කරයි. |
| 2 | මලිත්ත වැව | | | | | මාස් කන්නයේ දී පමණක් වගා කරයි.ගොවීන් සිටින්නේ සාලියපුර වසමෙහි ය. |
| 3 | යෝධමහ වැව | 7 | 7 | | | මාස් කන්නයේ දී පමණක් වගා කරයි.යල කන්නයේ දී ලවණතාවය මතු වේ. |
| 4 | මුරුංග වැව | | | | | පිටවාන කැඩී ඇත. |
| 5 | බුන්දල වැව | 14 | 7 | 108-122 | | 2023 මාස් කන්නයේ වර්ෂාවට වැව් බැම්ම කැඩී ඇත.<br>යල මහ දෙකන්නයේ දීම වගා කරයි.<br>යල කන්නය අසාර්ථක වන අතර මහ කන්නයේ දී සාර්ථක වී අස්වැන්නක් ලැබේ. |
| 6 | වැන්දැව වැව | | | | | වසර 25 කට පෙර සිටම වැව් බැම්ම කැඩී ඇත.එයට පෙර අක්කර 15 ක් වගා කර ඇත.<br>මෙම වැවෙහි ධීවර කර්මාන්තය කල හැක. |

**මුලාශ්‍රය-** එල්ලංගා කළමනාකරණ කමිටු සාමාජික ගොවි මහතුන්ගෙන් ක්ෂේත්‍රයේ දී ලබා ගත් තොරතුරු

## 1.5 එල්ලංගා කලමණාකරන කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර, එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට ආහාර පිසීම වැනි ගෘහ කටයුතු සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන 2 අනුව රාජ්‍ය,පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වූවද නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගා පද්ධති දැඩි ලෙස පරිහානියට පත්ව ඇත. එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගා පද්ධති තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී. එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

## 1.6 එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම

එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සඳහා එල්ලංගාව කලමණාකරනය හා සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. එසේම එල්ලංගා කලමණාකරන කමිටු නීතිගත කිරීමට ද අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි. පරිපාලන දිස්ත්‍රික්ක 11 කට අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53 ක් පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ. ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබා දේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ. ඒවා නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවි සංවිධාන, ප්‍රජා මූල සංවිධාන, ජල සම්පත් මණ්ඩලය, ආපදා කලමණාකරන ඒකකය, පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය, ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම යි. රාජ්‍ය ආයතන,පෞද්ගලික අංශය,ප්‍රජා මූල සංවිධාන ඇතුලු

පාර්ශවකරුවන් රාශියකට එල්ලංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇති අතර, ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහන 2 මගින් දක්වා ඇත.




රූපසටහන 2 එල්ලංගා පද්ධති කලමණාකරනය සඳහා වර්තමානයේ සම්බන්ධිත ප්‍රධාන ආයතන

## 1.7 එල්ලංගා කළමනාකරණ කමිටුවෙහි කාර්යභාරය සහ වගකීම

- ❖ එල්ලංගාවෙහි සියලුම ආයතන සහ ප්‍රතිලාභීන්ගේ ඒකාබද්ධ ප්‍රවේශයකින් එල්ලංගාවෙහි සම්පත් කළමනාකරණය කිරීමට කමිටුව අවශ්‍ය තීරණ ගත යුතු අතර, එම තීරණ ක්‍රියාත්මක කිරීම පසු විපරම් කර ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කළ යුතුය.
- ❖ අදාළ ගොවි සංවිධාන විසින් එල්ලංගාවෙහි සිදු කළ යුතු නඩත්තු කටයුතු පිළිබඳව කමිටුව සාකච්ඡා කළ යුතුය.
- ❖ එල්ලංගාව තුළ ඇති සංවර්ධන හා නිෂ්පාදන වැඩසටහන් සහ එල්ලංගාව තුළ ජලය සහ ආශ්‍රිත සම්පත් (පරිසර පද්ධති ඇතුළුව) කළමනාකරණය කිරීමේ සමස්ත වගකීම දැරිය යුතුය.
- ❖ ඒකාබද්ධ කළමණාකරණය තුළින් පානීය, කෘෂිකාර්මික, පශු සම්පත් සහ මිරිදිය ධීවර අවශ්‍යතා සාධාරණ ලෙස සපුරාලීම සහතික කිරීම
- ❖ දේශගුණික සුහුරු කෘෂිකාර්මික භාවිතයන් සහ තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම
- ❖ සමස්ත එල්ලංගාව සඳහා කෘෂිකාර්මික සංවර්ධන සැලැස්මක් සකස් කිරීම/ යාවත්කාලීන කිරීම
- ❖ කාලගුණ සහ කෘෂිකර්ම උපදේශන වෙත ප්‍රවේශ වීමට ප්‍රජාවට පහසුකම් සැලසීම
- ❖ එල්ලංගා මට්ටමින් සංවර්ධන වැඩසටහන් වල සහභාගීත්ව ක්‍රියාකාරකම් සංවිධානය කළ යුතුය
- ❖ කමිටුව 'කන්න' රැස්වීම්වල ප්‍රතිඵල සහ එල්ලංගා මට්ටමින් විසඳිය හැකි ගැටලු සාකච්ඡා කළ යුතුය.
- ❖ කමිටුව විසින් වගාව, ජල ගැටළු, යෙදවුම් සැපයීම, පුහුණු වැඩසටහන් සහ අනෙකුත් නිෂ්පාදන කටයුතු සැලසුම් කළ යුතු අතර නිෂ්පාදන අලෙවි කිරීමට කටයුතු කළ යුතුය.

## 1.8 එල්ලංගා පැතිකඩ සහ එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීමේ අවශ්‍යතාවය

මෙම එල්ලංගා කළමනාකරණ පැතිකඩ 2023 වර්ෂය තුළ ස්ථාපිත කරන ලද එල්ලංගා කළමනාකරණ කමිටුව වෙනුවෙන් දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය (CSIAP) විසින් සකස් කර ඇත. දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය (CSIAP) සඳහා ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ලද අතර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලදී. රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් නීත්‍යානුකූලව මෙහෙයවනු ලබන එල්ලංගා කළමනාකරණ කමිටුව පිහිටුවීම සහ ඒ අනුව එම කමිටුව ප්‍රාදේශීය ලේකම්වරයා ගේ ප්‍රධානත්වයෙන් යුත් අදාළ රාජ්‍ය සහ ප්‍රජා මූලික පාර්ශවකරුවන්ගේ නියෝජිතයන්ගෙන් සමන්විත වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ලේකම්වරයා විසින් ලබා දී ඇති මගපෙන්වීම අනුව තෝරාගත් ගොවි සංවිධාන නියෝජිතයෙකුට සම සභාපති තනතුර සෑම විටම ලබා දෙනු ලැබේ. CMC නීත්‍යානුකූල කිරීම සඳහා ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්වරයා බවට පත් කිරීම සඳහා වාරි ආඥාපනත යටතේ ඔහුට පැවරී ඇති බලය

අනුව හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. එල්ලංගා කළමනාකරණ පැතිකඩ සහ සැලැස්ම, පොදු සහ විශේෂිත ගැටළු, එල්ලංගාවේ වර්තමාන තත්ත්වය, සංවර්ධන අභියෝග, ව්‍යාපෘති මැදිහත්වීම් සහ සිදු කළ යුතු ක්‍රියාමාර්ග සහ යෝජිත මැදිහත්වීම් සහ වගකිවයුතු ආයතන සහ අරමුදල් අවශ්‍යතා විස්තරාත්මකව පැහැදිලි කිරීම ඇතුළුව එල්ලංගාව පිළිබඳ මූලික තොරතුරු සියල්ල සම්පූර්ණ කරයි.

## 1.9 විල්මැන්න එල්ලංගා පැතිකඩ සකස් කිරීමේ දී භාවිතා කල ක්‍රමවේදය

විල්මැන්න එල්ලංගා පැතිකඩ සකස් කිරීම සඳහා මූලාංශ්‍ර කිහිපයක් ඔස්සේ තොරතුරු ලබා ගන්නා ලදී. හරස්කඩ චාරිකා, ද්විතියික දත්ත, කණ්ඩායම් සාකච්ඡා ඒ අතර ප්‍රධාන වූ අතර, ද්විතියික දත්ත ලෙස ව්‍යාපෘතියේ සංවේදී කලාප සඳහා සකස් කරන ලද කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යාත්මක තක්සේරුව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලින් වනජීවී හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තු වලින් ලබා ගත් තොරතුරු භාවිතා කරන ලදී. මීට අමතරව ප්‍රාථමික දත්ත ජනනය කිරීම සඳහා හරස්කඩ චාරිකාවක්ද (Transect Walk) සියලු පාර්ශවකාර සංවිධානවල සහභාගීත්වයෙන් සිදුකරන ලදී.

එල්ලංගාවේ ප්‍රධාන ජල පෝෂක ප්‍රදේශ සියල්ල ආවරණය වන පරිදි එල්ලංගාවේ අවසන් වැව වන වැන්දැව වැව දක්වා හරස්කඩ චාරිකාවේදී තොරතුරු ලබා ගන්නා ලදී. මෙහි දී භූගෝලීය තොරතුරු, භූ විද්‍යාත්මක තොරතුරු, ජල විද්‍යාත්මක තොරතුරු, පරිසර විද්‍යාත්මක තොරතුරු, සමාජ ආර්ථික තොරතුරු, සම්පත් හායනය හා සම්පත් හායනයේ බරපතලකම පිලිබඳව නිරීක්ෂණ හා සාකච්ඡා මගින් තොරතුරු එකතු කර ගන්නා ලදී. හරස්කඩ චාරිකාව සඳහා ප්‍රතිලාභීන් ගොවි සංවිධාන සාමාජිකයින් හා අදාල සියලු රාජ්‍ය ආයතන වල නිලධාරීන් සහභාගී වූ අතර, චාරිකාවෙන් පසුව ඒ සඳහා සහභාගී වූ සියලු පාර්ශව වල සහභාගීත්වයෙන් වැඩමුළුවක් පවත්වා තොරතුරු වල නිරවද්‍යතාවය තවදුරටත් තහවුරු කරගන්නා ලදී.

විශේෂයෙන්ම මෙම එල්ලංගා පැතිකඩේ ඇති තොරතුරු එල්ලංගා කලමණාකරන මූලික සැලැස්ම සැකසීම සඳහා ඉතාමත් වැදගත් වන අතර, එල්ලංගාව අධ්‍යයනය කරනු ලබන අයට එල්ලංගාව පිලිබඳව තොරතුරු ලබා ගැනීමේදී සහ එල්ලංගාවේ ඉදිරි සංවර්ධන කටයුතු සැලසුම් කිරීමේ දී බෙහෙවින් ඉවහල් වනු ඇත.

## 1.10 විල්මැන්න එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ අරමුණු

එල්ලංගා පද්ධතියේ සම්පත් ආරක්ෂා කිරීම සහ ඒවායේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා එල්ලංගා කලමණාකරන වැඩසටහනක් දැඩි ලෙස අවශ්‍ය වී ඇත. එසේම එල්ලංගාවේ සියලුම පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය ඇතිව සුදුසු ආයතන ව්‍යුහයක් හරහා ඒකාබද්ධව ප්‍රවේශයකින්

යුක්තව එල්ලංගාව කලමණාකරනය කල යුතු වේ. ඒ සඳහා පහත අරමුණු ඉටු කර ගැනීම සඳහා එල්ලංගා පැතිකඩ සහ කලමණාකරන සැලැස්ම සකස් කරනු ලබයි.

- ප්‍රධාන වශයෙන් භූගෝල විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක, බෝග වගා රටාවන් සහ මානව ක්‍රියාකාරකම් නිසා එල්ලංගා පද්ධතියට වන හානි පිලිබඳ තොරතුරු සහ භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS) උපයෝගී කරගෙන සකස් කරන ලද සිතියමක්ද, ඇතුලත් විස්තරාත්මක එල්ලංගා පැතිකඩ (Cascade Profile) පාර්ශවකාර සංවිධාන වල ප්‍රයෝජනය සඳහා සැකසීම මගින් පාර්ශවකාර සංවිධාන වලට එල්ලංගාව සුරැකීමට පහසුකරණය කිරීම .
- එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු විසඳීම සඳහා වන උපාය මාර්ගික මැදිහත් වීම්, ඒ සඳහා වන දල වියදම් ඇස්තමේන්තු, ක්‍රියාත්මක කිරීමේ කාල වකවානු සහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මැදිහත්විය යුතු පාර්ශවකාර ආයතන යන මූලිකාංග ඇතුලත් එල්ලංගා පද්ධති කලමණාකරන මූලික සැලැස්මක් (Cascade Management Plan) සැකසීම.
- එල්ලංගා පද්ධතියේ වඩාත් උග්‍ර ගැටළු සහ ඒවා මගින් එල්ලංගා පද්ධතියට සිදු වී ඇති සහ සිදුවෙමින් පවතින හානි පිලිබදව ප්‍රතිපත්ති සම්පාදකයින් හා පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

එල්ලංගාව තුළ ආයතනික රාමුව ශක්තිමත් කිරීම එල්ලංගා පද්ධතිය කළමනාකරණය කිරීමේ ප්‍රධාන අවශ්‍යතාවලින් එකක් ලෙස හඳුනාගෙන ඇත. එබැවින්, එල්ලංගා මට්ටමේ සම්පත් (ජලය සහ ඉඩම්) කළමනාකරණය සඳහා ගොවි සංවිධාන සහ රේඛීය ආයතන නිලධාරීන්ගෙන් සමන්විත එල්ලංගා කළමනාකරණ කමිටුවක් (CMC) පිහිටුවා ඇත.

"එල්ලංගා කළමනාකරණ කමිටුවේ අවශ්‍යතාවය" යටතේ අරමුණු කිහිපයක් දැක්විය හැකිය. විල්මැන්න එල්ලංගාව සඳහා එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

- ඒකාබද්ධ කළමණාකරණය හරහා ජෛව විවිධත්වය (වෘක්ෂලතා සහ සත්ත්ව විශේෂ) වැඩිදියුණු කිරීම සඳහා පද්ධතියේ ජල පෝෂක ප්‍රතිසංස්කරණය කිරීම
- එල්ලංගාවේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවන් මුහුණ දෙන ජල හිඟය විසඳීම (ප්‍රදේශයේ ගොවිතැන්, පානීය හා පාරිසරික ජල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම)
- ජලය සහ ඒ ආශ්‍රිත ස්වභාවික සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම
- දේශගුණික විපර්යාසවල අවදානම අඩු කිරීම.
- එල්ලංගාව එක් පද්ධතියක් ලෙස ජල කළමනාකරණය කිරීම

## 1.11 එල්ලංගා කළමනාකරණ සැලැස්ම සැකසීමේ ක්‍රමවේදය

එල්ලංගා කළමනාකරණ කමිටුව සමඟ සාකච්ඡා කර ගොවි සංවිධාන නායකයින් සහ රේඛීය ආයතනවල අනෙකුත් කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් බිම් මට්ටමේ ගැටළු සහ ඒවා අවම කිරීමේ ක්‍රියාමාර්ග හඳුනා ගන්නා ලදී .මුළු එල්ලංගාවම ආවරණය කිරීම සඳහා අවශ්‍ය පරිදි ක්ෂේත්‍ර නිරීක්ෂණ සහ සාකච්ඡා කිහිපයක් සිදු කරන ලදී. මේවායින් පසුව, එල්ලංගා කළමනාකරණ සැලැස්ම සකස් කිරීම පිළිබඳ ඔවුන්ගේ අදහස් ලබා ගැනීම සඳහා කමිටුව සමඟ තවත් සවිස්තරාත්මක සාකච්ඡාවක් පවත්වන ලදී.

# 2. විල්මැන්න එල්ලංගා කළමනාකරණ පැතිකඩ

## 2.1 භූ විෂමතාවය සහ භූ රූපණය

විල්මැන්න එල්ලංගාවට අයත් ප්‍රදේශයේ සාමාන්‍ය උන්නතාංශය මුහුදු මට්ටමේ සිට ආසන්න වශයෙන් මීටර් 10 සිට මීටර් 40 ක් දක්වා වු පරාසයක විහිදෙන අතර,ඇතැම් ස්ථාන එයට වඩා ඉහල අගයක් ගනී.බෑවුම 0- 8% දක්වා වු පරාසයක විහිදේ. මෙම එල්ලංගා ප්‍රදේශයේ පස රතු දුඹුරු පස වේ.

මෙම එල්ලංගා පද්ධතිය බඳගිරිය ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් වන අතර, එය භූ රූපණය අනුව විජයාණු සංකීර්ණයේ පිහිටා ඇත.

විල්මැන්න එල්ලංගාවට අයත් ප්‍රදේශයේ භූ විෂඹතාවය පහත සිතියම 2 මගින් දක්වා ඇත.

**සිතියම 2** විල්මැන්න එල්ලංගාවට අයත් ප්‍රදේශයේ භූ විෂමතාවය




මූලාශ්‍රය ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

## 2.2 ඉඩම් පරිහරණය

විල්මැන්න එල්ලංගා පද්ධතියම **DL** 5 කෘෂි පාරිසරික කලාපයට ඇතුලත් වන අතර,මූලික වශයෙන් ප්‍රදේශයේ බහුල වශයෙන් රතු දුඹුරු පස දක්නට ඇති අතර එහි උප ස්ථරයේ බොරළු සහිත බවක් දක්නට ඇත. විල්මැන්න එල්ලංගා පද්ධතිය ආශ්‍රිත ප්‍රදේශයේ දැකිය හැකි ප්‍රධාන ඉඩම් පරිහරණයන් වන්නේ ළඳු කැලෑ,හේන්,කුඹුරු,සණ වනාන්තර සහ ගෙවතු වේ.

විල්මැන්න එල්ලංගා පද්ධතියෙහි ඉඩම් පරිහරණය සිතියම 3 මගින් ද,එයට අදාල දත්ත වගුව 5 මගින් ද,ඉඩම් පරිහරණයන් ව්‍යාප්ත වී ඇති ආකාරය රූප සටහන 3 මගින් ද පහතින් නිරූපණය කර ඇත.

**සිතියම 3 ඉඩම් පරිහරණය**




**මූලාශ්‍රය ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව**

වගුව 5 ඉඩම් පරිහරණ දත්ත

| **ඉඩම් පරිහරණ වර්ගය** | **බිම් ප්‍රමාණය(හෙක්ටයාර්)** |
|---|---|
| ළඳු කැලෑ | 571.48 |
| හේන් | 252.81 |
| කුඹුරු | 126.24 |
| ඝණ වනාන්තර | 94.48 |
| ජලතල | 47.61 |
| ගෙවතු | 39.71 |
| මුඩු බිම් | 12.66 |
| කඩොලාන | 2.29 |
| කන්න භෝග | 0.70 |
| **මුළු බිම් ප්‍රමාණය(හෙක්ටයාර්)** | 1147.98 |




රූප සටහන 3 ඉඩම් පරිහරණ ව්‍යාප්තිය

## 2.3 ජල විද්‍යාත්මක තොරතුරු

**වගුව 6 ජල විද්‍යාත්මක තොරතුරු**

| වැවෙහි නම | මසකට ලැබෙන ජල ප්‍රමාණය (අක්කර අඩි) | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් |
| විල්මැන්න වැව | | | | | | | | | | | | |
| මලිත්ත වැව | | | | | | | | | | | | |
| යෝධමහ වැව | | | | | | | | | | | | |
| මුරුංග වැව | | | | | | | | | | | | |
| බුන්දල වැව | | | | | | | | | | | | |
| වැන්දැව වැව | | | | | | | | | | | | |

දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ජල විද්‍යාත්මක අධ්‍යයනයේදී ඉහත වගුවේ විස්තර කර ඇති පරිදි එක් එක් වැව්වල ජලය ගලා ඒම ඇස්තමේන්තු කර ඇත. අධ්‍යයනයේදී ජලය ගලා ඒම, නැවත ප්‍රවාහය, වැවෙන් පිටාර ගැලීම, වාෂ්පීකරණය, කාන්දුවීම් සලකා බලන ලද අතර ඒ අනුව සම්පූර්ණ බෝග ජල අවශ්‍යතාවය ගණනය කරන ලදී.

නිසි ජල කළමනාකරණ සැලැස්මක් සහ ක්‍රියාත්මක හා නඩත්තු සැලැස්මක් හඳුන්වා දීමෙන් මෙම ප්‍රමාණය වැඩි කල හැකි වනු ඇත. තවද යල කන්නයේ දී වැව්වල පවතින ජලයෙන් වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා ක්ෂේත්‍ර භෝග හඳුන්වා දිය හැකිය. මෙම පිළිවෙත අනෙකුත් වැව් සඳහා ද හඳුන්වා දිය හැකි ය.

### 2.3.1 විල්මැන්න එල්ලංගා පද්ධතියේ වත්මන් තත්ත්වය




රූප සටහන 4 එල්ලංගා පද්ධතියක ප්‍රධාන අංග

- ❖ කුළු වැව (වන වැව) : වන සතුන් සඳහා ජලය සැපයීම, සුන්බුන් සහ රොන්මඩ පෙරීම සහ පිටාර ගැලීම හරහා ගමේ වැවට ඇතුළු වන වැසි ජලය රඳවා ගැනීම සඳහා ගමේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ ඉදිකර ඇත. වන සතුන්ට ජලය ලබා දීමෙන් මෙම වනාන්තර වැව් මඟින් ජලය සොයා ගමට පැමිණ වගාවන්ට හානි කිරීමේ සම්භාවිතාව අඩු කරයි.

  විල්මැන්න එල්ලංගා පද්ධතියේ කුළු වැව ලෙස ක්‍රියා වෙනත් එල්ලංගාවකට අයත් නාච්චිගෙ වැව යි.මෙම වැව ප්‍රතිසංස්කරණය කල හොත්, වනඅලින්ගෙන් එයට පහලින් පිහිටි වැව් යටතේ වගා කරනු ලබන කුඹුරු ඉඩම්වලට සහ හේන්වලට සිදු වන හානිය අවම කර ගත හැකි වනු ඇත.
- ❖ කායන් වැව : ඉහළ ජල පෝෂක ප්‍රදේශය එළිපෙහෙළි කර ඉදිකර ඇත. එය අවසාදිත පෙරීමට සහ ලවණතාව පාලනය කිරීමට භාවිතා කරයි. විල්මැන්න එල්ලංගා පද්ධතියේ මෙම වැව හඳුනාගෙන නොමැත.
- ❖ ඔලගම් වැව : ගමට ආසන්නව පිහිටා ඇති නමුත් ස්ථිර ජනාවාසයකට හෝ වගාවකට සම්බන්ධ නොවේ. එය ඍතුමය වගාවන් සඳහා ජල මූලාශ්‍රයක් ලෙස භාවිතා කරයි. විල්මැන්න එල්ලංගා පද්ධතියේ මෙම වැව් හඳුනාගෙන නොමැත.
- ❖ ගොඩ වල (ජල සිදුර) : ගම්බද ප්‍රධාන වැවේ රොන්මඩ හා අවසාදිත වීම වැලැක්වීම සඳහා රොන්මඩ පෙරා තැන්පත් කිරීම සඳහා ඉදිකර ඇත. මෙම වැව විල්මැන්න එල්ලංගා පද්ධතියේ හඳුනාගෙන නොමැත.

## 2.4 පාරිසරික තොරතුරු

විල්මැන්න එල්ලංගා පද්ධතිය තුල සණ වනාන්තර හෙක්ටයාර් 94.48 ක් සහ ළඳු කැලෑ හෙක්ටයාර් 571.48 ක් පිහිටා ඇත.එබැවින් මෙම එල්ලංගාව ජෛව විවිධත්වය අතින් පෝෂිතය.

මෙම එල්ලංගා ප්‍රදේශය බුන්දල ජාතික වනෝද්‍යානය සහ විල්මැන්න අභය භූමිය ආශ්‍රිතව පිහිටා ඇත. අභයභූමි යනු ශ්‍රී ලංකාවේ ආරක්ෂිත ප්‍රදේශ කාණ්ඩයක් වන අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලැබේ. 2006 වසරේ ජුනි 30 දින අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද විල්මැන්න අභය භූමිය වර්ග කිලෝමීටර් 33.39 ක බිම් ප්‍රමාණයකින් යුක්ත ය.

විල්මැන්න එල්ලංගාව අවට පිහිටා ඇති වනාන්තර වර්ග ලෙස වියළි විවෘත වනාන්තර හා කටු පඳුරු සහිත ලඳු කැලෑ බහුලව දැකිය හැකි වේ. මෙම ප්‍රදේශයේ පිහිටි වනාන්තරය බුන්දල කැලය ලෙස හඳුන්වයි. මෙහි එක් කොටසක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව බුන්දල ජාතික වනෝද්‍යානය යටතේ පරිපාලනය වේ. මෙහි විශාල ප්‍රමාණයේ ශාක වර්ග වශයෙන් පලු,කටුපිල,සියඹලා,කොහොඹ ශාක විශේෂ බහුලව පවතී. පඳුරු වශයෙන් එරමිණියා,රණවරා,මලිත්තන්,අන්දර,පොඩිසිංමරන් විශාල වශයෙන් පවතී. මීට අමතරව මෙම එල්ලංගාවෙහි සත්ව විශේෂ ලෙස අලියා සහ වල් මී හරකා වැනි සතුන් ද. ඉත්තෑවන්, මීමින්නන් වැනි කුඩා සතුන් ද දැකිය හැක.

මීට අමතරව උරග විශේෂ ලෙස තලගොයා, කබරගොයා, ගැට කිඹුලා, හැල කිඹුලන් හා සර්ප විශේෂ ලෙස නයා, පිඹුරා, පොළඟා, ඇහැටුල්ලා, වල් ගැරඬියා, අහර කුක්කා, මාපිලා, තෙල් කරවලා වැනි සතුන්ද කටුසු වර්ග ලෙස පලා කටුස්සා, ගරා කටුස්සන්, අං කටුස්සන් හා බෝදිලිමා වැනි විශේෂද හූනු විශේෂ ලෙස සුලභ ගේ හූනන්, තිත් හූනන් හා කිඹුල් හූනන් හමුවේ. මෙම ප්‍රදේශයේ දුර්ලභ ගනයේ පක්ෂීන් විශේෂ ලෙස අළු කොහා, සිලිබිල්ලා ,නිල් කිතලා, ලතුවැකියා,රත්මල් කිරලා දැකිය හැක. ආවේණික සතුන් ලෙස තරු ඉබ්බන් සිටියි. තවද වඳ වී යන සත්වයින් ලෙස කැබැල්ලෑවන්, හම්බාවන් එල්ලංගාව තුල ජීවත් වේ.

වනාන්තර වලින් ලබා ගන්නා සේවාවන් ලෙස මිනිසුන් දර කඩා ගැනීමට වනය නිතර භාවිතා කෙරේ. මීට අමතරව දිවුල්, පලු, වීර වැනි පලතුරු සොයාගැනීමට මිනිසුන් වනාන්තරය භාවිතා කරයි. සත්ව පාලනයේ යෙදෙන ගොවීන් තණකොල හා අනෙකුත් සතුන්ගේ ආහාර සඳහා සතුන් වනාන්තර වලට මුදා හරී. ඇතැම් පුද්ගලයින් වැලි හා පස් ලබා ගැනීමට මෙම වනාන්තර භූමි භාවිතා කරයි. ධීවර ප්‍රජාවට මිරිදිය මත්ස්‍යයින් අල්ලා ගැනීමට වනාන්තර ආශ්‍රිත වැව් භාවිතා කිරීම ද සුලභව සිදු වේ.

එල්ලංගාව ආශ්‍රිතව පරිසර පද්ධතිය මානව ක්‍රියාකරකම් හේතුවෙන් බෙහෙවින් බලපෑමට ලක්ව ඇති බව නිරීක්ෂණය විය. වැව් ඉහත්තාවේ පෝෂක ප්‍රදේශවල සහ එම වැව්වල ගිල්මේ සිදුවන අනවසර හේන් වගාව නිසා පාංශු ඛාදනය අධික වී ඇත. විශේෂයෙන්ම හේන් වගාව නිසා පසේ ජලය උරා ගැනීමේ හැකියාව අඩු වී ඇති අතර ලැබෙන ජලය පස් ද සෝදා ගෙන පහලට ගමන් කරයි. මේ නිසා භූගත ජල මට්ටමද පහල ගොස් ඇත. එසේම විද්‍යානුකූල ක්‍රමවේදයකින් තොරව සිදු කරන මෙම අනවසර හේන් වගාවේ සී සෑම මගින් බිම් සකස් කිරීම නිසා වර්ෂාවත් සමඟ පස් සෝදාගෙන විත් ජලමාර්ග වල හා වැව් වල රොන්මඩ තැන්පත් වේ. විශේෂයෙන්ම එල්ලංගාවේ සිදු වන හේන් වගාව සඳහා කැලය කැපීම නිසා වනගහනය ක්‍රමානුකූලව අඩු වෙමින් පවතී. හේන් වගාකරුවන්ගෙන් 50% කට වඩා වැඩි සංඛ්‍යාවක්, භූමි මාරු කරමින් හේන් වගාවේ නිරත වනු දක්නට ලැබුනි. හේන් වගාකරුවන් විසින් ස්වාභාවිකව ගලා යන ජල මාර්ග හරස් කර තම වගාවන්ට ජලය යොදා ගැනීම නිසා එල්ලංගාවේ ස්වාභාවික ලෙස ජලය ගලා යෑමට බාධා ඇති වී තිබේ.

එල්ලංගාව තුල වගා කරනු ලබන සෑම ඉඩමකටම විදුලි වැටවල් යෙදීම නිසා සතුන්ගේ ගමනාගමනයට බාධා වී ඇති අතර මේ නිසාම අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇත. එසේම සෑම වැවකම වැව් රක්ෂිතය දක්වා වගා කර ඇති අතර මේ නිසා වැව ආරක්ෂාව සඳහා තිබූ ගස් ගොම්මන විනාශ වී ඇත.

එල්ලංගාවේ සිදුවන කෘෂිකාර්මික ක්‍රම බොහෝමයක් දැකගත හැකිය. මෙහිදී හේන් වගාවන් බහුලව සිදු වේ. මෙහිදී සිදු වන වනාන්තර එළි පෙහෙළි කිරීම් එල්ලංගාවේ පැවැත්මට දැඩි තර්ජනයක් වී ඇත.

නිල් වලිග කුරුමිණි කුරුල්ලා



සියක්කාරයන්



**ඡායාරූප 1 සහ 2 එල්ලංගාව තුල දැකිය හැකි කුරුල්ලන්**

## 2.5 මානව ජීවනෝපාය කටයුතු සම්බන්ධ තොරතුරු

එල්ලංගාව තුල කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර් 379.05 ක් පමණ යොදා ගෙන ඇත.හේන් වගාව සඳහා යොදා ගෙන ඇති ඉඩම් සෑම මාස් කන්නයකම වගා නොකරන අතර, දළ වශයෙන් හෙක්ටයාර් 252.81 ක් පමණ මාස් කන්නයේදී වගාව කරනු ලබයි. ඉතිරිය ලඳු කැලෑ වශයෙන් පවතී. එසේම දැනට වගා කරන ඉඩම් වල පමණක් හේන් වගා කිරීමට අවසර ලබාදෙන නමුදු ගොවීන් අනවසරයෙන් වනාන්තර එළිපෙහෙළි කර හේන් වගාව සඳහා යොදා ගැනීම නිසා එල්ලංගාවේ වනාන්තර බිම් ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. හේන් වගා ඉඩම් වල මුං,රටකජු සහ කව්පී ප්‍රධාන වශයෙන් වගා කරන අතර මීට අමතරව මිරිස් වගාවද දක්නට ලැබේ. කෘෂිකාර්මික ඉඩම් පරිහරණ රටාව ගත් විට මාස් කන්නයේ හේන් වගාව සිදු කරනු ලබන අතර, යල කන්නයේ ජලය හිඟ වීම නිසා හේන් වගාව සිදු කරනු නොලබයි. විශේෂයෙන්ම හේන් වගාවේදී කිසිදු පාංශු සංරක්ෂණ ක්‍රමයක් භාවිතා නොකරන බැවින් එය එල්ලංගාවේ විශාල පාරිසරික ගැටළුවක් බවට පත් වී ඇති අතර එය එල්ලංගාවේ පැවැත්ම කෙරේ බෙහෙවින් බලපා ඇත. මෙය එල්ලංගාවේ පැවැත්ම කෙරේ බලපා ඇති විශාල තර්ජනයක් වන අතර කඩිනමින් අවිධිමත් හේන් වගාව විධිමත් කෘෂිකාර්මික ක්‍රම යටතේ සුක්ෂම බෝග වගා රටාවක් දක්වා වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් පවතී

නිදැල්ලේ ගවයින් ඇති කිරීම එල්ලංගාවේ පැවැත්මට විශාල තර්ජනයක් වී ඇති අතර, විශේෂයෙන්ම එල්ලංගාවේ පිහිටි සියළුම වැව් ආශ්‍රිතව එළ ගවයින් හා මී ගවයින් විශාල ප්‍රමාණයක්(500 ක් පමණ) සිටින බව සුහද ගොවි සංවිධාන නියෝජිතයන් සමග පැවති සාකච්ඡාවේ දී අනාවරණය.විය.විශේෂයෙන්ම සෑම වැවකම ඉහත්තාවේ හරක් ගාල් 02 බැගින් ඇති බව දැන ගැනීමට

ලැබිණි. මෙම නිදැල්ලේ ඇති කරන ගවයින් නිසා වැව් වල රොන්මඩ තැන්පත් වීම, ජලජ ශාක වර්ධනය මෙන්ම වැව් කණ්ඩි හා ඇලවල් විනාශ වීමටද ලක් වේ.

## 2.6 සමාජ ආර්ථික තොරතුරු

විල්මැන්න එල්ලංගාව ග්‍රාම නිලධාරි වසම් 02 කට අයත් වේ.එනම් බුන්දල සහ සාලියපුර ග්‍රාම නිලධාරි වසම් වේ.බුන්දල වසමෙහි මුළු ජන සංඛ්‍යාව 669 ක් වේ. කෙසේ වෙතත් මේ වනවිට පවුල් …... ක් පමණ එල්ලංගාවෙහි පදිංචි වී ඇති අතර, පවුල් …... පමණ කෘෂිකාර්මික කටයුතු සඳහා එම කටයුතු සිදු කරන කාලවලදී එල්ලංගාවට පැමිණේ. කෘෂිකාර්මික කටයුතු සිදුකරන කාලයේදී තාවකාලික පැල්පත් සාදා ගෙන ගොවීන් රාත්‍රි කාලය පමණක් ගත කරන අතර, අස්වනු නෙලා ගැනීමෙන් පසුව ඉවත්ව යයි. වැව් වල ජලය තිබෙන යල කන්න වලදී මුං හෝ වෙනත් කෙටි කාලීන බෝග වැව් යටතේ වගා කරන අතර ඒවා වගා කරන ගොවීන් එම කාලයේ ද තාවකාලිකව එල්ලංගාව තුල පදිංචි වී සිටී. මාස් කන්නයේදී ගොවීන් ...... ක් පමණ වැව් යටතේ ඇති කුඹුරු ඉඩම් වල, ජල ධාරා ප්‍රදේශ වල වගා කරන අතර වගා කරන ඉඩම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 126.24 ක් පමණ වේ. විශේෂයෙන්ම වැව් රක්ෂිත වල හා ජලමාර්ග ප්‍රදේශ වල මෙම ගොවීන් හේන් වගාවේ නිරත වන අතර, මේ නිසා පෝෂිත ප්‍රදේශ මෙන්ම වැව් ද විශාල තර්ජනයට ලක් වී ඇත. හේන් වගාව බිම් මාරු ක්‍රමයට සිදු වන අතර, එකම ඉඩමේ දීර්ඝ කාලයක් වගා කරන ගොවීන් ප්‍රමාණය ඉතා අඩුය. එසේම අලුතින් කැලෑ කපා හේන් වගාව සඳහා ඉඩම් එකතු කර ගැනීම ද සිදුවේ.හේන් වගාව මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වන බැවින් එය විධිමත්භාවයට පත් කිරීම හැර වෙනත් විකල්පයක් නොමැත.

## 2.7 එල්ලංගාව තුළ දැනටමත් සිදු කර ඇති ඉදිකිරීම් කටයුතු

එල්ලංගාව වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගැනෙන භූමි භාගයක පිහිටා ඇති බැවින් දැනට අලුතින් ඉදිකිරීම් කටයුතු සිදු නොවේ.එහෙත් 2025 වසරේ දී විල්මැන්න වැව,යෝධ මහ වැව,මුරංගා වැව සහ බුන්දල වැව දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ය.

## 2.8 එල්ලංගාවෙහි කෘෂිකාර්මික කටයුතු

විල්මැන්න එල්ලංගාව පද්ධතිය තුල ඇති වැව් යටතේ හෙක්ටයාර් 163 ක් පමණ වගා කරන අතර, එම වැව් යටතේ කෘෂි කටයුතු වල යෙදෙන ගොවි පවුල් සංඛ්‍යාව 67 ක් පමණ වේ . මීට අමතරව හේන් වගා කරන ගොවීන් සංඛ්‍යාව …... ක් පමණ වේ. එල්ලංගාවේ ප්‍රධාන පාංශු කාණ්ඩය රතු දුඹුරු පස වන අතර , ඊට අමතරව වැලි මිශ්‍ර ලොම් පස් හා බොරළු සහිත ගල් සහිත ප්‍රදේශයන් ද දැකිය හැක. මුළු

පද්ධතියට අයත් භූමි ප්‍රමාණයෙන් 33.0% ක් පමණ වගා කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර 58.0% ක් පමණ කැලෑ හා ලඳු කැලෑ වේ.

එල්ලංගාවේ වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මි.මී 1257 ක් වන අතර පසුගිය වසර 10 ක වර්ෂාපතන රටාව සැලකූ විට යල කන්නයට අඩු වර්ෂාපතනයකුත් මහ කන්නයට සාපේක්ෂව වැඩි වර්ෂාපතනයක් ද බොහෝ ප්‍රදේශවලට ලැබී ඇත. එල්ලංගා පද්ධතිය තුල වගා කටයුතු සිදු කරනු ලබන ප්‍රධාන වැව් 04 ක් ඇති අතර ,එම වැව් යටතේ මහ කන්නයේ ප්‍රමාණවත් වර්ෂාපතනයක් ලැබුනු පසු වී වගාවන් කිරීමත්, ගොඩ ඉඩම් ප්‍රදේශවල හෙක්ටයාර් 252.81 ක පමණ හේන් වගාවත් සිදු කරනු ලබයි. හේන් වල ප්‍රධාන වශයෙන් කුරක්කන්, මුං, කව්පි, රටකජු, තල වැනි බෝග වගා කරන අතර , මීට අමතරව මිරිස් හා එළවළු වර්ගද හේන් තුල වගා කරනු ලබයි. මහ කන්නය තුල වගා කරන භූමියෙන් 66.6% ක් පමණ හේන් වගා කරනු ලබන අතර 33.4% ක් පමණ වී වගාව කරනු ලබයි.
ජලය ප්‍රමාණවත් නොවීම නිසා යල කන්නයේදී එල්ලංගාවේ වැව් යටතේ වී වගාව කරනු ලබන බිම් ප්‍රමාණය අඩුවන අතර , එම කුඹුරු ඉඩම් වල මුං ඇට ,රටකජු, කව්පි වැනි බෝග බහුල වශයෙන් වගා කෙරේ. එසේම ජල හිඟය නිසා මහ කන්නයේ පවා කුඹුරු ඉඩම් වල වගා කිරීමට නොහැකි වී ඇත.

## 2.9 භෝග වගා රටාව

මෙම එල්ලංගාවෙහි වැව් යටතේ යල සහ මහ වගා කරන ප්‍රධාන බෝගය වී වේ. යෝධ මහ වැව,විල්මැන්න වැව,මලිත්තන් වැව සහ බුන්දල වැව යටතේ වගා කරන ගොවීන් මහ කන්නයේ වී ගොවිතැන සඳහා බිම් සැකසීම ආරම්භ කරයි. මුං ඇට,කව්පී,රටකජු වැනි අනෙකුත් ක්ෂේත්‍ර භෝග වගා කිරීම 1 වන මැද කන්නයේ සිදු කරනු ලැබේ. විල්මැන්න වැව සහ බුන්දල වැවෙහි ජලය තිබෙන ස්ථානවල යල කන්නයේ දි ද වී වගාව සිදු කරනු ලබයි. එහෙත් බොහෝ ගොවීන් මැද කන්නයේ කිසිදු භෝගයක් වගා නොකරයි. එය වගුව 7 මගින් පහත දක්වා ඇත.

මිරිස්, රටකජු, මුං ඇට සහ කව්පි වැනි අනෙකුත් ක්ෂේත්‍ර බෝග වර්ෂාපතනය යටතේ උස් බිම්වල වගා කෙරේ. ගොවීන් කිහිප දෙනෙකුට තම වගාවන්ට ජලය සැපයීමට පහසුකම් ඇත. පොල් වැනි බහු වාර්ෂික බෝග ගණනාවක් තිබේ. අඹ, මුරුංගා .දෙළුම්.දොඩම් සහ කෙසෙල් ද මෙම ප්‍රදේශයේ ඇත.

මෙම එල්ලංගාව යටතේ වැව් 04 ක් දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මගින් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ය.

එම ප්‍රතිසංස්කරණයන් හේතුවෙන් යල කන්නයේ කුඹුරුවල විශේෂයෙන්ම වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීමට අවස්ථා රාශියක් ඇත. 1 සහ 2 මැද කන්නයේ වගා කිරීමේ විභවය මෙම එල්ලංගාව තුළ ඉහළ මට්ටමක පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස බෝග තීව්‍රතාවය මෙන්ම ගොවීන්ගේ ආදායමද ඉහළ නැංවිය හැකිය.

සජීවී වසුන් යෙදීම, කාබනික පොහොර යෙදීම, දෙමුහුන් බීජ යෙදීම, ඒකාබද්ධ ශාක පෝෂණ කළමනාකරණය සහ ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය වැනි විවිධ දේශගුණ සුහුරු කෘෂිකාර්මික තාක්ෂණයන් හඳුන්වා දීම මෙන්ම හැකි සෑම විටම ක්ෂුද්‍ර වාරිමාර්ග, පැරෂුට් ක්‍රමය භාවිතා කිරීම සහ අතිරේක ජලය ලබා දීම බෝගය වැඩිදියුණු කිරීමට උපකාරී වේ. එල්ලංගාවෙහි ජල ඵලදායිතාව මෙන්ම පස හා පරිසරය ආරක්ෂා කිරීම ඉතා වැදගත් වේ. එබැවින් මෙම ප්‍රදේශයේ නැවත වන වගා සහ පාංශු සංරක්ෂණ කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. ගෙවතු ප්‍රදේශයේ කෘෂි වන වගාව ප්‍රවර්ධනය කිරීම පරිසරයේ තිරසාර බව පවත්වා ගැනීමට උපකාරී වේ. සංරක්ෂණ ගොවිතැන සහ ක්ෂුද්‍ර වාරිමාර්ග ක්‍රම වැනි අධි තාක්‍ෂණික කෘෂිකර්මාන්තය හඳුන්වාදීම ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීමට උපකාරී වේ.

වගුව 7 මගින් පසුගිය වසර තුන තුළ විවිධ භෝග යටතේ වගා කරන ලද භෝගවල ව්‍යාප්තිය සහ වගාව සඳහා යෝජිත බෝග පෙන්වයි.

**වගුව 7 පසුගිය වසර 03 තුල වගා කරන ලද බිම් ප්‍රමාණයන් පිලිබඳ විස්තර**

| අනු අංකය | වැව | 2023 යල | | 2022/23මහ | | 2022 යල | | 2021/22 මහ | | 2021 යල | | 2020/21 මහ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | වී* | වෙනත් ක්ෂේත්‍ර භෝග* | වී* | වෙනත් ක්ෂේත්‍ර භෝග* | වී* | වෙනත් ක්ෂේත්‍ර භෝග* | වී* | වෙනත් ක්ෂේත්‍ර භෝග* | වී* | වෙනත් ක්ෂේත්‍ර භෝග* | වී* | වෙනත් ක්ෂේත්‍ර භෝග* |
| 1 | විල්මැන්න වැව | 80 | - | 80 | - | 80 | - | 80 | - | 80 | - | 80 | - |
| 2 | මලිත්ත වැව | | | | | | | | | | | | |
| 3 | යෝධමහ වැව | 35 | - | 35 | - | 35 | - | 35 | - | 35 | - | 35 | - |
| 4 | මුරුංග වැව | 30 | - | 30 | - | 30 | - | 30 | - | 30 | - | 30 | - |
| 5 | බුන්දල වැව | - | - | - | - | 18 | - | 18 | - | 18 | - | 18 | - |
| -6 | වැන්දැව වැව | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| **මුළු බිම් ප්‍රමාණය** | | **145** | | **145** | **-** | **163** | **-** | **163** | **-** | **163** | **-** | **163** | **-** |

***බිම් ප්‍රමාණයන් අක්කර වලින් දක්වා ඇත.**

**මුලාශ්‍රය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

2022/2023 මහ කන්නයේ දී සහ 2023 යල කන්නයේ දී බුන්දල වැව යටතේ වගා කර නැත.එයට හේතුව එම මහ කන්නයේ දී පැවති අධික වර්ෂාව හේතුවෙන් එම වැවෙහි වැව් බැම්ම කැඩී යාම යි.ඉහත වගුව 7 ට අනුව පෙනී යන්නේ වැව් යටතේ වී වගා කිරීමට වැඩි නැඹුරුවක් දක්වන බව යි. වෙනත් ක්ෂේත්‍ර භෝග වගා කිරීමේ දී වන සතුන්ගෙන් වන හානිය මෙන්ම ප්‍රමාණවත් පරිදි ජලය නොමැති වීම ද දැක්විය හැක.

වගුව **8** **දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපාතිය මගින් වැව් පුනරුත්ථාපනයෙන් පසු එක් එක් බෝගය යටතේ වගා කිරීමට යෝජිත බිම් ප්‍රමාණය**

| අනු අංකය | වැව | ප්‍රමාණය (අක්කර) | යල කන්නයේ දී වගා කිරීමට යෝජිත භෝගය සහ බිම් ප්‍රමාණය(අක්කර) | | | | | මහ කන්නයේ දී වගා කිරීමට යෝජිත භෝගය සහ බිම් ප්‍රමාණය (අක්කර) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | භෝගය සහ බිම් ප්‍රමාණය(අක්කර) | | | | | භෝගය සහ බිම් ප්‍රමාණය (අක්කර) |
| | | | මුංඇට | රටකජු | Black gram | කව්පි | මිරිස් | වී |
| 1 | විල්මැන්න වැව | 80 | - | - | - | - | - | 80 |
| 2 | මලිත්ත වැව | | - | - | - | - | - | |
| 3 | යෝධමහ වැව | 35 | - | - | - | - | - | 35 |
| 4 | මුරුංග වැව | 30 | - | - | - | - | - | 30 |
| 5 | බුන්දල වැව | 18 | - | - | - | - | - | 18 |
| 6 | වැන්දැව වැව | - | - | - | - | - | - | - |
| **මුළු බිම් ප්‍රමාණය(අක්කර)** | | **163** | **-** | - | - | - | - | 163 |

**මූලාශ්‍රය** **ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

විල්මැන්න වැව ආශ්‍රිත ප්‍රදේශයේ ලවණතාවය සාපේක්ෂව අඩු වුව ද,එහි ඇතැම් කුඹුරුවල ලවණතාවය යෝධ මහ වැව ට ද බලපා ඇති අතර, යෝධ මහ වැව ආශ්‍රිත ප්‍රදේශයේ ලවණතාවය අධික අතර, විශේෂයෙන්ම යල් කන්නයේ දී කුඹුරුවල ලවණතාවය මතු වේ.එබැවින් රනිල භෝග වගා නොකරයි.

# 3. එල්ලංගාවෙහි වාරි කළමනාකරණ විස්තර

විල්මැන්න එල්ලංගාවෙහි වැව් 06 ක් ඇති අතර, ගොවි සංවිධාන 01 ක් ක්‍රියාත්මක වේ.එම ගොවි සංවිධානය සුහද ගොවි සංවිධානයයි. ගොවි සංවිධාන තම වගා රැස්වීම් පවත්වා වැඩි වශයෙන් ක්‍රියා කරන්නේ රැස්වීමේ දී ගත් තීරණය අනුව ය. යල කන්නයේ දී වගාවට ජල හිඟය ඇත්තේ යෝධ මහ වැවෙහි සහ මලිත්තන් වැවෙහි ය. සමහර අවස්ථාවල යල කන්නයේ ඇති වූ අනපේක්ෂිත වියළි කාලගුණය හේතුවෙන් ප්‍රායෝගිකව අයහපත් අත්දැකීම් තිබේ.

## 3.1 පෝෂක ප්‍රදේශය

**වගුව 9 පෝෂක ප්‍රදේශ විස්තර**

| වැව | සැලසුම් කළ බිම් ප්‍රදේශය(අක්කර) | දැනට වගා කෙරෙන ප්‍රදේශය(අක්කර) |
|---|---|---|
| විල්මැන්න වැව | | 80 |
| මලිත්ත වැව | | |
| යෝධමහ වැව | | 35 |
| මුරුංග වැව | | 30 |
| බුන්දල වැව | | 18 |
| වැන්දැව වැව | | - |
| **මුළු බිම් ප්‍රමාණය(අක්කර)** | | **163** |

**මූලාශ්‍රය දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ ඉංජිනේරු සමීක්ෂණය**

**(GEO-INFO MAPPING (PRIVATE) LIMITED, 2021)**

දැනට ඉහත වැව් යටතේ කුඹුරු අක්කර 163 ක් වගා කෙරේ. 2019 - 2024 වසර තුළ ක්‍රියාවට නංවන ලද කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මඟින් මෙම වැව් අතරින් විල්මැන්න වැව,යෝධ මහ වැව,මුරුංග වැව සහ බුන්දල වැව 2025 වසරේ දී ප්‍රතිසංස්කරණය කිරීමට යෝජිත ය. එහි ප්‍රතිඵලයක් ලෙස තවත් කුඹුරු අක්කර ...... ක් පද්ධතියට එකතු වනු ඇත. එමගින් එම ගොවීන්ට ප්‍රතිලාභ ලැබෙනු ඇත.

වගුව 10 වැව් අනුව ඇල මාර්ග විස්තර

| අනු අංකය | වැව | ඇල මාර්ගය | දිග (මීටර්) | වගා කරන ඉඩම් ප්‍රමාණය(අක්කර) |
|---|---|---|---|---|
| 1 | විල්මැන්න වැව | | | 80 |
| 2 | මලිත්ත වැව | | | |
| 3 | යෝධමහ වැව | | | 35 |
| 4 | මුරුංග වැව | | | 30 |
| 5 | බුන්දල වැව | | | 18 |
| 6 | වැන්දැව වැව | | | - |

**මූලාශ්‍රය** **දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියේ ඉංජිනේරු සමීක්ෂණය**

(GEO-INFO MAPPING (PRIVATE) LIMITED, 2021)

## 3.2 එල්ලංගාව මුහුණ දෙන ගැටළු

විල්මැන්න එල්ලංගාව මුහුණ දෙන ගැටළු ප්‍රධාන ,උග්‍ර සහ වෙනත් ලෙසත් වර්ගීකරණය කර පහත දැක්වේ. එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා කඩිනමින් අවධානය යොමු කල යුතු යැයි තීරණය කරන ලද මැදිහත්වීම් ඇතුලත් ගැටළු, උග්‍ර ගැටළු ලෙස හඳුනා ගන්නා ලදී. සහභාගිත්ව ක්‍රමවේදය භාවිතා කර ප්‍රධාන පාර්ශවකරුවන් සමග එකතු වී සහභාගිත්ව හා තාත්වික ආකාරයට උග්‍ර ගැටළු හඳුනා ගන්නා ලදී.

## 3.3 ප්‍රධාන ගැටළුව

විල්මැන්න එල්ලංගා පද්ධතිය මුහුණ දෙන ප්‍රධාන ගැටළුව වන්නේ පිහිටි වාරි ඇළ මාර්ග ක්‍රමවත් නොවීම සහ විශේෂයෙන්ම කෙත් ඇළ නිසියාකාරව නොවීම වේ. විල්මැන්න එල්ලංගාවෙහි පිහිටි ප්‍රධානම වැව වන විල්මැන්න වැවට වීරවිල වැවෙන් ජලය ගලා එන පළුගස්වැව ආර පටු වී තිබීම ප්‍රධානම ගැටළුවයි.

## 3.4 උග්‍ර ගැටළු

විල්මැන්න එල්ලංගාවෙහි පිහිටි ප්‍රධානම වැව වන විල්මැන්න වැවට වීරවිල වැවෙන් ජලය ගලා එන පළුගස්වැව ආර පටු වී තිබීම මෙන්ම එල්ලංගා පද්ධතියේ වාරි ඇළ මාර්ග ක්‍රමවත් නොවීම සහ කෙත් ඇළ නිසියාකාරව නොවීම උග්‍රම ගැටළු බවට පත්ව ඇති අතර,එය මුළු එල්ලංගා පද්ධතියේම ජලවහන රටාව කෙරෙහි දැඩි බලපෑමක් එල්ල කර ඇත.

'විල්මැන්න පාර' ලෙස ගොවීන් විසින් හඳුන්වනු ලබන විල්මැන්න බෝධිය අසල සිට විල්මැන්න වැව දක්වා කිලෝමීටර් 4.0 ක පමණ දුරකින් යුත්, වැවට සහ කුඹුරු යායවලට පහසුවෙන්ම යා හැකි මාර්ගය,දැනට අබලන් වී ඇති බැවින්,එම මාර්ගය භාවිතා කරන 37 දෙනෙකු පමණ වූ ගොවීන් ට දුෂ්කරතා මතු වීම උග්‍ර ගැටළුවක් ලෙස දැක්විය හැක.

## 3.5 වෙනත් ගැටළු

1. එල්ලංගාවෙහි ඇතැම් වැව් ආශ්‍රිත කුඹුරු යායන් හි ලවනතාවයක් ඇති වීම- විල්මැන්න වැව ආශ්‍රිත ප්‍රදේශයේ ලවණතාවය සාපේක්ෂව අඩු වුව ද,එහි ඇතැම් කුඹුරුවල ලවණතාවය යෝධ මහ වැව ට ද බලපා ඇති අතර, යෝධ මහ වැව ආශ්‍රිත ප්‍රදේශයේ ලවණතාවය අධික අතර, විශේෂයෙන්ම යල් කන්නයේ දී කුඹුරුවල ලවණතාවය මතු වේ.

2. විල්මැන්න එල්ලංගා පද්ධතියට අයත් මුළු බිම් ප්‍රමාණයෙන් 58.0% ක් බුන්දල ජාතික වනෝද්‍යානයට අයත් සණ කැලෑ, ළඳු කැලෑ සහ තෙත් බිම් වලින් සමන්විත බැවින්,එම පද්ධතියෙහි පිහිටි කුඹුරු සහ අතිරේක ආහාර භෝග වගාවන් සහිත හේන්වලට විශේෂයෙන්ම වනඅලින් සහ අනෙකුත් වනජීවීන් වන වල් ඌරන්,මොණරුන්,රිලවුන් සහ ඉත්තෑවන්ගෙන් සිදු වන හානි දැක්විය හැක.

   මෙම තත්වය සමස්ථ එල්ලංගා පද්ධතිය තුලම දක්නට ඇති අතර,වැන්දෑව වැව ආශ්‍රිතව උග්‍ර ලෙස දක්නට ලැබෙන්නේ එහි වැව් බැම්ම කැඩී වසර 25 ක් පමණ ගත වී ඇතත්,මෙතෙක් කිසිදු ප්‍රතිසංස්කරණයකට භාජනය නොවීම යි. එබැවින් වන සතුන්ටඅවශ්‍ය ජලය රඳවා ගැනීමට නොහැකිව ඇත

3. එමෙන්ම විල්මැන්න වැව ඉහල ප්‍රදේශයෙහි අනවසරයෙන් හේන් වගාව සිදු කිරීම හේතුවෙන්, පාංශු ඛාදනය සහ වැව් වල රොන්මඩ තැන්පත් වීම,හේන් වගාව සඳහා වන ආවරණය ඉවත් කිරීම හේතුවෙන් වන ගහනය අඩු වීම, වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය විනාශ වීම දැකිය හැකි ය.
4. එල්ලංගාව තුල ගවයින් 500 ක් පමණ නිදැල්ලේ ඇති කිරීම සහ සෑම වැවකම පාහේ වැව් ඉහත්තාවේ ගව ගාල් 02 ක් පමණ ඉදිකර තිබීම නිසා වැව් කණ්ඩි සහ ඇල ඉවුරු වලට හානි සිදුවීම, වැව්වල රොන්මඩ තැන්පත් වීම සහ ජලජ ශාක වර්ධනය වීම සිදු වී ඇත.
5. එල්ලංගා පද්ධතිය තුල පිහිටි ගම්වල(බුන්දල සහ බුන්දලගම) ජීවත් වන්නන් හට පානීය ජලය නොමැති වීම ද තවත් ගැටළුවකි.
6. කට්ටකඩුව, ගස් ගොම්මන ආදී සාම්ප්‍රදායික වාරි පරිසර පද්ධති විනාශ වීම ද මෙම එල්ලංගාවෙහි දැකිය හැක.
7. එල්ලංගාවේ සෑම වැවකම වැව් රක්ෂිත නොමැති නිසා වැව්වල රොන්මඩ තැන්පත් වීම ඉහල යාම

8. වර්ෂාව නොලැබීම හේතුවෙන් ඇති වන ජල හිඟය නිසා වැව් යටතේ යල කන්නයේ දී වගාකිරීමට නොහැකි වීම

හරස්කඩ චාරිකාව සහ ක්ෂේත්‍ර කටයුතුවල දී ස්ථානීය පිහිටීම් සහිතව හඳුනා ගත හැකි වූ ගැටළු පහත සිතියම 4 මගින් දක්වා ඇත.

**සිතියම 4** විල්මැන්න එල්ලංගා පද්ධතිය ඇතුලත් ප්‍රදේශයෙහි ස්ථානීයව හඳුනා ගත් ගැටළු




**මූලාශ්‍රය** ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

# 4. එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම

**වගුව 11 එල්ලංගා කළමනාකරණ මූලික සැලැස්ම**

| අනු අංකය | ගැටළු විසඳීම සඳහා වූ උපායමාර්ගික මැදිහත්වීම වලට අදාලව යෝජිත ප්‍රධාන ක්‍රියාකාරකම් | දල ඇස්තමේන්තුව (රුපියල් මිලියන) | 2023 | | | | 2024 | | | | 2025 | | | | වගකීම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | 1 කාර්තුව | 2 කාර්තුව | 3 කාර්තුව | 4 කාර්තුව | ප්‍රධාන | වෙනත් |
| 1 | එල්ලංගා පද්ධතියේ වාරි ඇළ මාර්ග සහ කෙත් ඇළ නිසියාකාරව සකස් කිරීම<br><br>විල්මැන්න වැවට වීරවිල වැවෙන් ජලය ගලා එන පළුගස්වැව ආර නියමිත වාරි ප්‍රමිතීන්ට අනුව පුළුල් කිරීම | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |
| 2 | විල්මැන්න බෝධිය අසල සිට විල්මැන්න වැව දක්වා කිලෝමීටර් 4.0 ක පමණ දුරකින් යුත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 3 | ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල යෝග්‍ය පරිදි කිවුල් ඇල වල් ඉදිකිරීම. | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 4 | වැන්දැව වැවෙහි වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 5 | නව හේන් වගාවන් සඳහා කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවැත්වීම සඳහා කටයුතු කිරීම | | | | | | | | | | | | | | ප්‍රාදේශීය ලේකම්,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 6 | එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය,සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 7 | නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගව හිමියන් යොමු කිරීම. | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය,සත්ව නිෂ්පාදන | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව | |
| 8 | වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර ඒවා කඩිනමින් ඉවත් කිරීම | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |
| 9 | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඹය, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, අපවහන ඇලවල් මනාව නඩත්තු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය | ගොවි සංවිධාන |
| 10 | එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. | | | | | | | | | | | | | | පලාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සදහා දේශගුණික සුහුරු වගා ක්‍රම හදුන්වා දීම හා ව්‍යාප්ත කිරීම | | | | | | | | | | | | | | දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |
| 12 | විදුලි වැට නිරන්තරයෙන් නඩත්තු කිරීම සහ ජෛව බාධක ස්ථාපිත කොට පවත්වා ගෙන යාම | | | | | | | | | | | | | | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව | ගොවි සංවිධාන |

වගුව 12 දළ ඇස්තමේන්තු රේඛීය ආයතන අතර බෙදී යාම සහ අපේක්ෂිත ප්‍රජා දායකත්වය

| අනු අංකය | ප්‍රධාන කාර්යය | මුළු වියදම(රුපියල් මිලියන) | පුද්ගලික පාර්ශවයන්ගේ දායකත්වය | රේඛීය ආයතනවල දායකත්වය | ප්‍රජා දායකත්වය | අරමුදල් සපයන ආයතනයෙන් අපේක්ෂිත දායකත්වය |
|---|---|---|---|---|---|---|
| 1 | එල්ලංගා පද්ධතියේ වාරි ඇළ මාර්ග සහ කෙත් ඇළ නිසියාකාරව සකස් කිරීම<br>විල්මැන්න වැවට වීරවිල වැවෙන් ජලය ගලා එන පළුගස්වැව ආර නියමිත වාරි ප්‍රමිතීන්ට අනුව පුළුල් කිරීම | | | | | |
| 2 | විල්මැන්න බෝධිය අසල සිට විල්මැන්න වැව දක්වා කිලෝමීටර් 4.0 ක පමණ දුරකින් යුත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | | | | | |
| 3 | ලවණතාවයට ගොදුරු වී ඇති කුඹුරු ඉඩම් වල යෝග්‍ය පරිදි කිවුල් ඇල වල් ඉදිකිරීම. | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | වැන්දෑව වැවෙහි වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම | | | | | |
| 5 | නව හේන් වගාවන් සඳහා කැලෑ කැපීම සම්පූර්ණයෙන්ම නැවැත්වීම සඳහා කටයුතු කිරීම | | | | | |
| 6 | එල්ලංගාව තුල නිදැල්ලේ ගවයින් ඇති කිරීම නිසා වාරි පද්ධතියට වන හානිය සහ ගුණාත්මයෙන් ඉහල ගවයින් ඇති කිරීම තුලින් ලබා ගත හැකි වාසි පිලිබඳව ගව හිමියන් දැනුවත් කිරීම. | | | | | |
| 7 | නිදැල්ලේ ගවයින් ඇති කිරීම වෙනුවට සූක්ෂම ගව පාලනය සඳහා ගව හිමියන් යොමු කිරීම. | | | | | |
| 8 | වැව් තුල ඇති ගවගාල් වලින් වැවට වන හානිය පිලිබඳව ගව හිමියන් දැනුවත් කර ඒවා කඩිනමින් ඉවත් කිරීම | | | | | |
| 9 | පුරාණ වාරි පද්ධතියේ පැවැති කට්ටකඩුව, ගස්ගොම්මන, පෙරහන, තිස්බඔය, එල්ලංගාවේ සෑම වැවකම නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම, අපවහන ඇලවල් මනාව නඩත්තු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම සඳහා | | | | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | ගොවි සංවිධාන වල ක්‍රියාකාරී දායකත්වය ලබා ගැනීම. | | | | | |
| 10 | එල්ලංගාවේ ඇති සෑම වැවකම රක්ෂිත මායිම් ලකුණු කොට රක්ෂිත සීමාවේ සිට මීටර් 20 ක වත් ප්‍රේරණ කලාපයක් ඇති කොට එම ප්‍රේරණ කලාපයේ වන වගා කිරීම. | | | | | |
| 11 | උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම සඳහා දේශගුණික සුහුරු වගා ක්‍රම හඳුන්වා දීම හා ව්‍යාප්ත කිරීම | | | | | |
| 12 | විදුලි වැට නිරන්තරයෙන් නඩත්තු කිරීම සහ ජෛව බාධක ස්ථාපිත කොට පවත්වා ගෙන යාම | | | | | |

මෙම එල්ලංගා කළමනාකරණ සැලැස්ම සංවර්ධනය කිරීම සඳහා දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර, ප්‍රධාන ගැටළු, තීරණාත්මක ගැටළු සහ අනෙකුත් සාමාන්‍ය ගැටළු සහ ක්‍රියාවලියේදී පාරිසරික හා සමාජීය අංශ කෙරෙහි අවධානය යොමු කරමින් යෝජිත මැදිහත්වීම් ඇතුළත් කරන ලදී. නමුත් සම්පූර්ණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම සඳහා ඉහත වගුවේ දක්වා ඇති සියලුම මැදිහත්වීම් සඳහා විශාල ආයෝජනයක් අවශ්‍ය වේ. ව්‍යාපෘති නිලධාරීන්, ලෝක බැංකු නියෝජිතයන් සමඟ පැවැත්වූ සාකච්ඡා කිහිපයක ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් ක්‍රියාකාරකම් සඳහා සහභාගීත්ව ක්‍රමය හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතු කිහිපයක් අතරමැදි කිරීමට එකඟ වේ. ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී එයට වගකිවයුතු රේඛීය ආයතන සහ ගොවීන්ගේ මූල්‍ය සහ ශ්‍රම දායකත්වය ඇතුළුව වඩා හොඳ මැදිහත්වීමක් අවශ්‍ය වේ. දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය ඉංජිනේරු සැලැස්ම සහ ඇස්තමේන්තු සකස් කිරීම, ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ ලෝක බැංකුවේ අනුමැතිය ලබා ගැනීම, පාර්ශවකරුවන්ගේ රැස්වීම් සංවිධානය කිරීම සහ රේඛීය නියෝජිතායතන සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා ප්‍රධාන සම්බන්ධීකරණ කාර්යභාරයක් ඉටු කරනු ඇත.  අපේක්ෂිත ක්‍රියාකාරකම්, දළ ඇස්තමේන්තුව සහ කාල රාමුව පහත වගුවේ විස්තර කර ඇත.

වගුව 13 ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ දේශගුණික සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය විසින් අපේක්ෂිත මැදිහත්වීම

| අනු අංකය | යෝජිත ප්‍රධාන කාර්යය | දළ ඇස්තමේන්තුව(රුපියල් මිලියන) | 2024 | | | | 2025 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි |
| 1 | එල්ලංගා පද්ධතියේ වාරි ඇළ මාර්ග සහ කෙත් ඇළ නිසියාකාරව සකස් කිරීම | | | | | | | | | | |
| 2 | විල්මැන්න වැවට වීරවිල වැවෙන් ජලය ගලා එන පළුගස්වැව ආර නියමිත වාරි ප්‍රමිතීන්ට අනුව පුළුල් කිරීම | | | | | | | | | | |
| 3 | විල්මැන්න බෝධිය අසල සිට විල්මැන්න වැව දක්වා කිලෝමීටර් 4.0 ක පමණ දුරකින් යුත් මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | | | | | | | | | | |
| 4 | වැන්දැව වැවෙහි වැව් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම | | | | | | | | | | |
| 5 | සූක්ෂම ගව පාලනය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | | | | | | | | | | |
| 6 | ඉපැරණි වාරි පද්ධතියේ මෙන් වැව්වල කට්ටකාඩුව, ගුස්ගොම්මන, පෙරහන, තිස්බඹය, අපජල ඇළ | | | | | | | | | | |

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මාර්ගවල පරිසර පද්ධතිය නැවත ස්ථාපනය කිරීම හෝ වැඩිදියුණු කිරීම. | | | | | | | | | | |
| 7 | පරිසර පද්ධති පිළිබඳ විද්‍යාත්මක අවබෝධය, තිරසාර නඩත්තුවේ වැදගත්කම සහ එකඟ වූ ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් පැවැත්වීම. | | | | | | | | | | |
| 8 | තිරසාර පරිසර හිතකාමී ගොවිතැන් ක්‍රම (කාබනික ගොවිතැන, ස්වභාවික පළිබෝධනාශක, කොම්පෝස්ට් නිෂ්පාදනය, ශෂ්‍ය මාරුව, පුනර්ජනනීය කෘෂිකාර්මික ක්‍රම ආදිය පිළිබඳව ගොවි සංවිධාන පුහුණු කිරීම. | | | | | | | | | | |
| 9 | පවත්නා විදුලි වැටවල් නඩත්තු කිරීම සහ නව විදුලි වැටවල් අවශ්‍ය ස්ථානවල ස්ථාපිත කිරීම | | | | | | | | | | |

## ඇමුණුම 1 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍රලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | 7/3/9/CMC/2023 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2023.08. 03 |

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.</u>
**<u>Cascade Management Committee (CMC) Establishment & Continuity</u>**

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාර්ග (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක වශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) එල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ එල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම එල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රශමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) පනත පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ වශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

<u>3.1. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ</u>

i. එල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, අමුණු හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී පරිසර පද්ධති තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල අවශ්‍යතාවයන් පිරිමසමින් ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, சேர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා ලගනකුන් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

## 3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

## 3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායි ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායිතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මග පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නිතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සැම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

## <u>3.4. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවේ සංයුතිය</u>

### 3.4.1 <u>ප්‍රාදේශිය මට්ටම</u>

මෙම කමිටුව අදාල ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

- **i.** ප්‍රාදේශිය ලේකම්
- **ii.** ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරී
- **iii.** කෘෂිකර්ම උපදේශක
- **iv.** පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
- **v.** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශිය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරි
- **vi.** කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
- **vii.** ග්‍රාම නිලධාරි
- **viii.** සමෘද්ධි සංවර්ධන නිලධාරි
- **ix.** ආර්ථික සංවර්ධන නිලධාරී
- **x.** ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xi.** පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xii.** ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
- **xiii.** පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
- **xiv.** පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
- **xv.** සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xvi.** කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
- **xvii.** වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරි
- **xviii.** වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xix.** වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xx.** භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
- **xxi.** ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
- **xxii.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xxiii.** සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- **xxiv.** පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
- **xxv.** ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
- **xxvi.** ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

**xxvii.** වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශීය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරි
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරී හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

***සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.***

**<u>3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම</u>**

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

**<u>3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම</u>**

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටුවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඒ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

## ඇමුණුම 2 උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය

**මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ලබා ගැනීම සඳහා උප ව්‍යාපෘති යෝජනාවක් (SPPs) සකස් කිරීමේ ආකෘතිය.**

**1.** පරිපාලන විස්තර:

| අනු අංකය | කරුණු | විස්තර |
|---|---|---|
| 1 | යෝජනා ඉදිරිපත් කරන නියෝජිතායතනයේ සම්බන්ධතා විස්තර: (තැපැල්, විද්‍යුත් තැපෑල, දුරකථන ආදිය | |
| 2 | ක්‍රියාත්මක කරන නියෝජිතායතනයේ සම්බන්ධතා විස්තර: (තැපැල්, ඊමේල්, දුරකථන ආදිය) | |
| 3 | යෝජනාවේ තොරතුරු සැපයීම සඳහා වගකිව යුතු පුද්ගලයාගේ තනතුර සමඟ සම්බන්ධතා විස්තර (ඊමේල්, දුරකථන - ඉඩම / ජංගම: | |
| 4 | යෝජනාවේ අංශය (වැව් ප්‍රතිසංස්කරණය / ජල පෝෂක ප්‍රතිකාර / කෘෂිකාර්මික භාවිතයන් / අලෙවිකරණය / ආයතනික සංවර්ධනය / තාක්‍ෂණය මාරු කිරීම / පුහුණු කිරීම / වෙනත් (නිශ්චිත කරන්න). | |
| 5 | ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවේ (DAC) එකඟතාවයේ අංකය. | |

**2.** උප ව්‍යාපෘති විස්තර:

**2.1.** උප-ව්‍යාපෘතියේ මාතෘකාව (මෙම නම ව්‍යාපෘති සංවර්ධන අරමුණට බොහෝ දුරට සමාන විය හැකි නමුත් සෑම විටම නොවන බව කරුණාවෙන් සලකන්න):

.......................................................................................................

**2.2.** උප ව්‍යාපෘතියේ සාරාංශය (කරුණාකර එය කුමක්ද, ඇයි, එය කවුද, එය කොහේද සහ එය ක්‍රියාත්මක කරන්නේ කවදාද යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන ඉතා කෙටි ඡේදයක් දෙන්න? ඇස්තමේන්තුගත මුළු පිරිවැය ද අවශ්‍ය වේ)

.

.......................................................................................................

**2.3.** ව්‍යාපෘතියේ පිහිටීම (එල්ලංගාව , ගොවිජන සේවා මධ්‍යස්ථානය, පළාත් පාලන ආයතනය , ග්‍රාම නිලධාරී වසම යනාදී විස්තර. ව්‍යාපෘති පිහිටීම ගංවතුර හෝ නියඟයට ගොදුරු විය හැකි ප්‍රදේශයක් ලෙස සලකන්නේ නම්, කරුණාකර එය ද දක්වන්න).

.......................................................................................................

**2.4.** ව්‍යාපෘති ගැටළු/තාර්කික/සාධාරණීකරණය (මෙය ඉතා වැදගත් වන අතර යෝජනාවේ ප්‍රධාන කොටස ලෙස සැලකේ. එම නිසා කරුණාකර ගැටලුව කුමක්ද, එය ගොවීන්ට බලපාන්නේ කෙසේද, එය හඳුනාගත් ආකාරය සහ සිදුවන අයහපත් ප්‍රතිඵල මොනවාද යන්න ඉස්මතු කරන්න.(එම ගැටළු විසඳා නැත්නම් )

.

.......................................................................................................

**2.5.** තීරණාත්මක ගැටලුව හඳුනාගත්තේ කෙසේද? (ප්‍රජා උපදේශන, ගොවි සංවිධානවල ඉල්ලීම්, එල්ලංගා කළමනාකරණ සැලැස්ම යනාදිය හරහා)

.

.......................................................................................................

**2.6.** උප ව්‍යාපෘතියේ පරමාර්ථය (අධීක්ෂණ කාර්යය සඳහා වැදගත් වන බැවින් කරුණාකර මෙය ඉතා තාර්කික ආකාරයෙන් සකස් කරන්න).

.......................................................................................................

**2.7.** නිශ්චිත අරමුණු (SMART ආකෘතියට අනුව නිශ්චිත අරමුණු සංවර්ධනය කළ යුතු අතර මෙය අධීක්ෂණ කාර්යය සඳහා ද ඉතා වැදගත් වේ.

**1.**

**2.**

**2.8.** **යෝජිත උප-ව්‍යාපෘති ක්‍රියාකාරකම් (මෙම කොටස ඉතා තාර්කිකව විස්තර කිරීමට අවශ්‍ය වන අතර තීරණාත්මක ගැටළුව විසඳීමට ක්‍රියාත්මක කරන ආයතනය යෝජනා කළ ක්‍රියාමාර්ග මොනවාද සහ එය ව්‍යාපෘති අරමුණ සාක්ෂාත් කර ගැනීමට දායක වන්නේ කෙසේද?**

**……………………………………………………………………………………………………………**

**2.9.** **අපේක්ෂිත ප්‍රතිඵල (මේවා ආර්ථික, දේශපාලනික, සමාජීය, පරිසරය, සංස්කෘතික, පෝෂණ ආදිය විය හැක)**

**1.**

**2.**

**2.10.** **ප්‍රතිලාභීන් (ප්‍රතිලාභීන්ගේ ස්වභාවය - පිරිමි සහ ගැහැණු සංඛ්‍යාවට අමතරව, යුද්ධයෙන් පීඩාවට පත් වූ අඩු ආදායම්ලාභී හෝ ආදිවාසී කණ්ඩායම්වලට අයත් වීම වැනි වෙනත් ලක්ෂණ ද දක්වන්න.)**

**……………………………………………………………………………………………………………**

**2.11.** **ක්‍රියාවට නැංවීමට සහභාගී වන්නේ ප්‍රතිලාභීන්ගෙන් කවුරුන්ද?**

**2.12.** **කාන්තාවන්ට ප්රතිලාභ ලැබෙන්නේ කෙසේද?**

**……………………………………………………………………………………………………………**

**2.13.** **O&M සඳහා ඇස්තමේන්තුගත පිරිවැය ඇතුළුව මෙහෙයුම් සහ නඩත්තු (O&M) සඳහා වගකිව යුත්තේ කවුද?**

**……………………………………………………………………………………………………………**

**2.14. විභව අවදානම් සහ අවදානම් අවම කිරීමට උපාය මාර්ගික යෝජනා**

**2.15. ව්‍යාපෘතිය සෘණ ලැයිස්තුවට හෝ නියමිත ලැයිස්තුවට වැටෙන්නේද?**

**(a) ඔව් නම්, කරුණාකර IEE හෝ EIA අවශ්‍ය දැයි පැහැදිලි කරන්න.**

**…………………………………………………………………………………………………**

**(b) නැත නම්, IEER/EIS ආකෘතිය අවශ්‍ය වේ.**

**2.16. උප ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විය හැකි යෝජිත ගොවි සංවිධානවල හෝ නිෂ්පාදක සංවිධානවල නම්/නම් (අදාළ නම්, විස්තර අමුණන්න අවශ්‍ය වේ)**

**…………………………………………………………………………………………………**

**3. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය**

**3.1. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත්තේ කෙසේද සහ කුමන පාර්ශ්වකරුවන් සමඟද? (ප්‍රමාණවත් විස්තර සහිතව විස්තර කරන්න)**

……………………………………………………………………………………………………

**3.1.** **ටෙන්ඩර් ක්‍රියාවලිය (අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමට සැලසුම් කර ඇති ආකාරය පැහැදිලි කරන්න).**

**3.2.** **ක්‍රියාකාරි සැලැස්ම (කාල රාමුව සහ ක්‍රියාත්මක කරන වගකිවයුතු ආයතන/පුද්ගලයින් සමඟ ක්‍රියාකාරකම් සැලැස්ම විස්තර කරන්න. මෙය Gantt ප්‍රස්ථාරයක් භාවිතයෙන් විස්තර කළ යුතුය).**

**4.** **උප ව්‍යාපෘතිය අධීක්ෂණ යාන්ත්‍රණය: (මෙය ඉතා වැදගත් වේ. එබැවින් ප්‍රමාණවත් විස්තර සපයමින් අධීක්ෂණ කටයුතු සිදු වන ආකාරය විස්තර කරන්න).**

……………………………………………………………………………………………………

**5.** **උප ව්‍යාපෘති ඇගයුම් යාන්ත්‍රණය: (කරුණාකර ක්‍රියාත්මක කරන ආයතනය ව්‍යාපෘතිය ඇගයීමට සැලසුම් කරන්නේ කෙසේද සහ කුමන කාල පරාසයන් වලදීද යන්න දක්වන්න)**

……………………………………………………………………………………………………

**6.** **වාර්තාකරණ විධිවිධාන (මූල්‍ය සහ ප්‍රගති වාර්තාකරණය සහ අපේක්ෂිත කාලසීමාව යන දෙකම සිදුකිරීමේ වගකීම භාරගන්නේ කවුරුන්ද යන්න විස්තර කරන්න)**

7. **ඇස්තමේන්තුගත පිරිවැය:**

| අංකය | ප්‍රධාන කාර්යය | මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් වලින් | ප්‍රජා දායකත්වය රුපියල් | වෙනත් මූලාශ්‍ර (නිශ්චිත) රුපියල් | දායක නියෝජිතායතනයෙන් අපේක්ෂිත මුදල රුපියල් |
|---|---|---|---|---|---|
| **1** | | | | | |
| **2** | | | | | |

**8.** **ඉදිරිපත් කිරීම**

**8.1.** **එල්ලංගා කළමනාකරණ කමිටුව (CMC) වෙනුවෙන් උප ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කිරීමට බලයලත් පුද්ගලයා**

**8.2.** **තනතුර, සම්බන්ධතා තොරතුරු, මුද්‍රාව, ඉදිරිපත් කළ දිනය**

**09.** **ඇමුණුම් :**

**(උප ව්‍යාපෘති යෝජනාව සාධාරණීකරණය කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු සැපයීමට සහ එමඟින් අනුමත කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කරුණාකර අදාළ සියලුම අමතර විස්තර අමුණන්න.)**